# Sinhalese Grammar

for

## Standard VII

by

The Revd. Theodore G. Perera

# සිංහල ව්‍යාකරණ

හත්වෙනි ප්‍රමාණයට

ගෞ. තියඩෝර් ජී. පෙරේර උන්නාන්සේ

විසින්

ආණ්ඩුවේ ව්‍යවස්ථාපොතට එකඟව

සම්පාදනය කරනලදී.

කොළඹ

ලඞ්කාතිලක යන්ත්‍රාලයේ

මුද්‍රිතයි.

1909.

# සිංහල ව්‍යාකරණ
# Sinhalese Grammar

**හත්වෙනි ප්‍රමාණයට.**

## 1. පදසතරේ විශෙෂ විභාග.
## The Four Parts of Speech in Detail.

### 1. නාමපදය.

1. නාමපදය නාමය, සර්වනාමය, සමාසනාමය, ප්‍රත්‍යයාර්ථනාමයයි සතර වැදෑරුම්වේ.

**නාමය.**

2. ලිඞග, විභක්ති හා වචනගැනීමෙන් සර්වාර්ථයන් ඒ ඒ අතට නමන ශබ්දයෝ නාමපදවෙත්. ලිඞගාදිය ගැනිමට ප්‍රථම ඊට ශබ්දප්‍රකෘතියයි කියනුලැබේ.

**කුමර** යනු ශබ්ද ප්‍රකෘතියි. කුමරා, කුමරී, කුමරුවන්, කුමරියන් ආදිය නාමපදයි.

ඇතා, ගස, ගල යනාදිය මේනයින් නාමපදයි.

3 නාමශබ්දයෝ, **ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥ**යයි පස්කොටසකට බෙදෙත්.

(1) සචෙතනික මිනිස් ආදි ඒ ඒවර්ගයන්ගේ විශෙෂ ඇතත් ඒ නොතකා ඔවුන්ගේ සාමාන්‍යය හඟවන ශබ්ද **ජාති** ශබ්ද නම්වෙත්.

උදා:– මිනිස්, ගොන්, දෙමළ, වඩු, බමුණු.

(අ) **මිනිස්** යන ශබ්දය සිහළ, දෙමළ, අරමණ ආදි නානා වර්ගවල සාමාන්‍යය හඟවනහෙයින් ඒ ජාති ශබ්දයි.

(ආ) **සොන්** යන ශබ්දය සියලුආකාරගුණහවයින්ව විශේෂණයක් නොසලකා සාමාන්‍යවශයේ ව්‍යවහාරවනහෙයින් ඒද ජාතිශබ්දයි.

(ඉ) **දෙමල** යන ශබ්දය කෙරළ, වඩුග ආදි ගෝත්‍රභේදයන් නොසලකා ජාතියේ සැමටම සාමාන්‍ය වශයෙන් ව්‍යවහාරවන හෙයින් ඒද ජාතිශබ්දයි.

(ඊ) වඩු ශබ්දය තච්ඡක, රථකාරාදි විශේෂණයන් නොසලකා සැම වඩුවන්ගේ සාමාන්‍යය හඟවත් හෙයින් ඒද ජාතිශබ්දයි.

(උ) බමුණු යනශබ්දය සොත්ථිය, නෙසාදාදි පඞ්ක්ති භේදයක් නොසලකා බ්‍රාහමණ වංශික සැමිටම සාමාන්‍ය වශයේ හාමිනාවන හෙයින් ඒද ජාතිශබ්දයි.

(2) අචේතනික වස්තූන් හඟවන ශබ්ද ද්‍රව්‍යශබ්ද නම්.

උදා:- ගස්, වැල්, ලී, දඬු, අං, දළ, කුඹු, පිළී.

ගුණඇතට අදරවූයේ ද්‍රව්‍යයි සිදත්සඟරාවේ කියනලදි. ගුණඇතට යන්නෙන් ගුණ, ක්‍රියා, සංඥා යන ශබ්දයන්ට ද්‍රව්‍යය ආධාරවන බැව් දක්වනලදී. කළු සුදු ආදි ගුණ ශබ්දයන්ටද, හිටුවීම්, සෑදීම් ආදී ක්‍රියා ශබ්දයන්ටද කොළඹ, තමුණුකුළ ආදි සංඥා ශබ්දයන්ටද පිළි, ගස්, නුවර ආදි ද්‍රව්‍යයෝ ආධාරවෙත් යයි එසේ කියනලදි.

තුමුත් මාගධ වෛයාකරණයෝ ජාති ශබ්දයන්ට ද්‍රව්‍යයන් ආධාරබැව්ද කීහු. මිනිස් යන ජාතිශබ්ද වාච්‍ය තැනැත්තේ ඇතිවූයේ සම්, මස්, අත්, පා ආදි ද්‍රව්‍ය ආධාරකොට ගෙන හෙයින් එසේ සලකනලදි.

(3) ද්‍රව්‍යයකා පිහිටි පැහැසටහන් ආදිය හඟවන ශබ්ද ගුණ ශබ්ද නම්.

උදා:- සුදු, මිටි, තර, තපුරු ආදියයි.

(4) කිරීම්, වීම්, කරන්නෙකු, වන්නෙකු ආදිය හඟවන ශබ්ද ක්‍රියා ශබ්ද නම්.

උද:- නටනු, නැවිලි, නටන්නා, නැවෙන්නී යනාදියයි.

මෙහි නටනු ආදි ක්‍රියාමාත්‍රය පමණක් හඟවන ශබ්ද භාව ක්‍රියා ශබ්දයයිද, නටන්නා ආදි ක්‍රියාව කරන තැනැත්තා හඟවනශබ්ද අන්‍ය ක්‍රියා ශබ්දයයිද කියනු ලැබෙත්.

(5) වෙන්කර හැඳිනගැන්ම පිණිස ජාතිශබ්දයකට හෝ ද්‍රව්‍යශබ්දයකට පණවනලද්ද සංඥා ශබ්ද නම්වේ.

උද:- පැරාක්‍රම්බා, අමරසේකර, සෝමා, රත්මැණිකා, සෙංකඩගල, සමනල ආදියයි.

මිනිසුන්කෙරෙන් එක්තැනැත්තකු හැඳිනගැනීම පිණිස අමරසේකර කියාද, ගැහුනුන් අතුරෙන් එක්තැනැත්තියකු හැඳිනගැනීම පිණිස සෝමා කියාද, නගරඅතුරෙන් එක්නුවරක් දක්වන පිණිස සෙංකඩගල කියාද, කඳුඅතරෙන් එකකන්දක් පෙන්වන පිණිස සමනල කියාද නම්කිරීම සංඥා යයි දතයුතු.

(6) "අර එන දළ ඇති ලොකු ඇතා සුවඳ නම්," යන්නෙන් එකමවාක්‍යයෙහි පඤ්චවිධ ශබ්දම යෙදී ඇතිසැටි පෙනේ.

අන්වර්ථ ආරූඪ ශබ්ද. (අනුරූත්, අරූඪ)

4. නාමශබ්දයෝ තවක්‍රමයකින් අන්වර්ථය, ආරූඪ යයි දෙකොටසකට බෙදෙත්.

(1) අර්ථයට අනුව සෑදීතිබෙන ශබ්ද අන්වර්ථ නම්:

පෙතිසියයක් ඇතියන අර්ථයෙන්සිඩ "**සියපත්**" යනුද, පියයුත්තායන අර්ථයෙන් සිද්ධ **පැත්** යනුද, අතක් ඇතියේයන අර්ථයෙන් සිද්ධ **ඇත්, කිරි** යනුද, ඊට නිදර්ශනයි.

(2) අර්ථයට විරුද්ධව සෑදීතිබෙන ශබ්ද **ආරූඪ** නම්.

වසත්‍ර ඇත්තේය යන අර්ථයෙන් සිද්ධ "සෙලු" යනු නිර්වස්ත්‍රතැනැත්තාට නමකි. තෙල්බොනයන අර්ථයෙන් සිද්ධ "තෙල්බූ" යනු තෙල්නොබොන සතෙකුටනමකි. මඞ්ගලයන අර්ථයෙන් සිද්ධ "මඟුල්" යනු ජෝර්‍ය්‍යාශාස්ත්‍රයෙහි අශුභයයි සලකන අඟහරු නම් ග්‍රහයාට නමකි. එබැවින් සෙලු; තෙල්බූ, මඟුල් යන ශබ්ද ආරූඪශබ්දයි.

සැලකියයුතුයි. (1) හෙලුවෙන් ආදි ශබ්ද සෑදෙන්නේ සෙලු යන්නෙනි.

(2) තෙල්බූයනු තෙල්දිනි නම්වේ. ඒ එක්තරා ක්ෂුද්‍ර ජන්තුවිශෙෂයකි. ඒ කැරපොත්තන්ට නමක් යයි කිසිවෙක් සලකති.

(3) ශබ්දාදි ක්‍රියානිමිත්තකොට ගෙන කිකිණි,* කැස්වටු†, ආදි ශබ්ද අනුකරණ ශබ්දයයි තවත්කොටසකට බෙදා ඇතම් අය දක්වති. නුමුත් ඒ අන්වර්ථ කොටසටම ඇතුළත්යයි හඟිමු.

### 1 වෙනි අභ්‍යාස පාඨය.

1. තනිඅකුරෙන්වූ පද 5 ක්ද, අකුරුදෙකින් යෙදෙන පද 5 ක්ද, අකුරු කීපයකින් යෙදෙන පද 5 ක්ද ලියනු.

---

*කිඞකිණි යනශබ්ද කරනහෙයින් කිකිණිනම්. ගෙජ්ජියි.

†කැස්යන ශබ්දය කරනවටුවා කැස්වටු නම්.

1. පොළෝ, නෙළුඹු, ගහනු, විසල්, යත්නේ, සීගිරි, ගින්දු, අසුර, කෑම, ඇස්, දුවන්නී, අනුරා, එල, ගොවි, කලාල, රට, ලංකාතිලක, පඬි, ගොළු අඹා සහ ගුරුයන ශබ්දයෝ පඤ්චවිධ ශබ්දයන් අතුරෙන් කිනම්මුදූයි වෙන් වෙන්කොට දක්වනු.

2. මෙහිපහත දක්වන ශබ්ද අන්වර්ථ ආරූඪ වශයෙන් වෙන්කොට අර්ථදක්වනු.

හූ, උරා, කැසුබු, කොස්, හනික, දද, සියඹලා, දිගැසි, බැණුම්, කැවුම්, හුහ.

## සර්ව නාමය.

5. සියල්ලන්ට ව්‍යවහාරකරන නොහොත් අන්‍යනාමයක් වෙනුවට යොදන නාම සර්වනාමයි. ලිඞ්ගත්‍රයටම කියහැකි හෙයින් ඒ සර්වනාමයයි ඇතැම් ආචාර්‍ය්‍ය මතයෙකි.

“මම” යනු තමන්ගැන කථාකිරීමේදි සියල්ලන් විසින් ව්‍යවහාර කරනුලැබේ.

“උඹ” යනු අභිමුඛවූ සියල්ලන්ට කථාකිරීමෙහි යෙදේ.

“ඔහු” “මොහු” යනු අනිකෙකුගැන කථාකිරීමෙහිදි සියල්ලන්ටම යෙදියහැකියි.

6. සර්වනාමය, ප්‍රථමපුරුෂය, මධ්‍යමපුරුෂය, උත්තමපුරුෂය කියා කොටස්තුනකට බෙදේ.

(1) අනුන්ගැන කථාකිරීමේදි ව්‍යවහාරකරන ඒ ශබ්දය ප්‍රථමපුරුෂයෙහිවේ.

(2) අභිමුඛවූවන්ට කථාකිරීමේදි ව්‍යවහාරකරන ශබ්දය මධ්‍යමපුරුෂයෙහි වේ.

(3) තමන්ගැන කථාකිරීමේදි ව්‍යවහාරකරන ශබ්දය උත්තමපුරුෂයෙහි වේ.

### සමාසනාම.

7. ශබ්ද කීපයක් එකතුව එකශබ්දයක්වීමෙන් සෑදෙන නාම සමාසනාම නම්වේත්. සමාසයනු සඞ්ක්ෂිප්ත කිරීමයි.

උදා:- කිරි + බත් - කිරිබත්
සුදු + මල් - සුදුමල්
දිවි + වග + වලස් - දිවිවගවලස්
සපු + නා + පනා - සපුනාපනා
නිල් + උපුල් - නිලුපුල්

### 4. ප්‍රත්‍යයාර්ථනාම.

8. ධාතුවකින් හෝ නාමයකින් පරකොට ප්‍රත්‍යයන් යෙදීමෙන් සිද්ධකරන ශබ්ද ප්‍රත්‍යයාර්ථනාම නම් වේත්.

මේශබ්දවල අර්ථය ඇතිවන්නේ ප්‍රත්‍යය හෙතුකොට ගෙන හෙයින් ඒ නාමය දීතිබේ.

උදා:- කර + උ - කරු (කර්තෘයි)
දා + අන් - දන් (දනයයි)
තොට + ඉ - තොටි (තීර්ථපාලයායි)
දන + තා - දනතා - දෙනෙතා (ජනතාවයි).

### 2. ක්‍රියාපද

9. කිරීම්, වීම් ආදි අර්ථවාචි ධාතු ප්‍රකෘතින්ට කාරකාදියක්නිසා ප්‍රත්‍යයවැටීමෙන් සෑදෙනපද ක්‍රියාහෙවත් ආඛ්‍යාතපද නම්වේත්.

වලඳති, කැපිණි, කරවයි, දිනෙම්වා, කියව, යතොත්, ගොස්, ලියමින් ආදිය ඊට උදාහරණයි.

මෙහි විශෙෂවිභාග මීටප්‍රථම ග්‍රන්ථයක විස්තර කරන ලද්දේය.

## උපසර්ගපද.

10. නාමපදවල හෝ ක්‍රියාපදවල මුලයෙදී නානාර්ථ ප්‍රකාශකරන වචන උපසර්ගපද නම්වේ. උපසර්ගපද ගණනින් විස්සෙකි.

උපසර්ගයනු ඉදිරියේ වැටීමයි හෙවත් ලංව වැළඳ ගැන්මයි. ඒ මෙසේයි.

| උපසර්ග. | | | උපසර්ග සහිත පද. | | |
|---|---|---|---|---|---|
| සිංහල | මාගධ | සංස්කෘත | සිංහල | මාගධ | සංස්කෘත |
| ප | ප | ප්‍ර | පමණ | පමාණ | ප්‍රමාණ |
| පර | පරා | පරා | පැරද | පරාජය | පරාජය |
| අව | අව | අව | අවලකුණු | අවලක්ඛණ | අවලක්ෂණ |
| ස | සං | සම් | සඟ | සංසග්ග | (සම්සර්ග) සංසර්ග |
| අනු | අනු | අනු | අනුදැන | අනුඤ්ඤා | අනුඥා |
| නි | නි | නිර් | නිවන් | නිබ්බාණ | නිර්වාණ |
| දු | දු | දුර් | දුදන | දුජ්ජන | දුර්ජන |
| වි | වි | වි | විලස් | විලාස | විලාස |
| අ | ආ | ආ(ඞ්) | අදර | ආදර | ආදර |
| අදි | අධි | අධි | අදියර | අධිකාර | අධිකාර |
| සු | සු | සු | සුවඳ | සුගන්ධ | සුගන්ධ |
| උ | උ | උත් | උපත | උප්පත්ති | උත්පත්ති |
| අබි | අභි | අභි | අබිසෙස් | අභිසෙක | අභිෂේක |
| පිරි | පරි | පරි | පිරිහුත් | පරිහානි | පරිහානි |
| උප | උප | උප | උපලකුණු | උපලක්ඛණ | උපලක්ෂණ |
| අප | අප | අප | අපසද | අපසද්ද | අපශබ්ද |
| පස් | පති | ප්‍රති | පස් + අක් | පති + අක්ඛ | ප්‍රති+අක්ෂ |
| | | | පසක් | පච්චක්ඛ | ප්‍රත්‍යක්ෂ |
| පිළි | පටි | ,, | පිළිවෙත් | පටිපත්ති | ප්‍රතිපත්ති |

| | | | | | |
|---|---|---|---|---|---|
| අති | අති | අති | **අති**ගැඹුරු | අ**ති**ගම්භීර | අ**ති**ගම්භීර |
| පි | අපි | අපි | **පි**යන් | (අ)පිධාන | අ**පි**ධාන |

සැලකියයුතුයි. (1) යථොක්ත උපසර්ගපද නානාර්ථයෙහි යෙදෙතහෙයින් එයින් සංසිද්ධ ශබ්දයන්ගෙන් එහි අර්ථ දැනගතයුතු. ඔව්හු අර්ථ බාධාකිරීමෙහිද, අර්ථයට අනුව පැවැත්මෙහිද, විශෙෂාර්ථයක් දක්වීමෙහිද යෙදෙත්.

(2) **පර** යන උපසර්ගය මාත්‍රාවෘද්ධිවීමෙන් **පැර** කියාද, **උප** යන උපසර්ගය ආදෙශයෙන් **උව** කියාද, **අති** යන උපසර්ගය ලොපයෙන් "**ඉ**" කියාද, ඇතැම් විට සිද්ධවේ. පැරකුම්, උවසර, ඉකුත්යනු ඊට නිදර්ශනයි.

(3) ඇතැම්විට උපසර්ගකීපයක් එකට ගැළපී යෙදෙත්. **සු පිරි** සිදු, **අති උ** දුල ආදිය ඊට නිදසුනුයි.

———oo———

## 4. නිපාතපද.

11. නාමක්‍රියා ආදි පදයන්ගේ මුල මැද අග යෙදී නොයෙක් අර්ථ ප්‍රකාශකරන පදයෝ **නිපාත** නම්වෙති. නිපාතයනු වැටීමයන අර්ථයි.

උදාහරණ:—

නාමපදයක මුල– **අ** කුසල් = අ + කුසල්
නාමපදවල මැද–කිරි **සහ** පැනි=කිරි+**සහ**+පැනි
නාමපදයක අග– රජහු**ම** = රජහු + **ම**
ක්‍රියාපදයක මුල–**නො**කෝලෙම්=**නො**+කෙලෙම්
ක්‍රියාපදවල මැද– යන්නෙහි**නම්** යව=
යන්නෙහි + **නම්** + යව
ක්‍රියාපදයක අග– ගියේලූ = ගියේ + **ලූ**
නානා පද අතර– දිවි ඇතිතෙ**ක්ම අපිරිසිදු
දෙයකුදු නොකරව්.**

මෙහි **නොක්** යන නිපාතය ඇති යන ක්‍රියාපද යට පරවද, ම යන නිපාත ය **නොක්** යන නිපාත පද යට පරවද, අ යන නිපාතය **පිරි** යන උපසර්ගය පෙර වද, **දු** යන නිපාතය දෙයක් යන නාම පදයට පර වද **නො** යන නිපාතය කරවී යන ක්‍රියාපදයට පෙරින් ද යෙදීතිබේ.

12. ඇතම් නිපාතයෝ නොයෙක් විසිතුරු අර්ථ ප්‍රකාශකෙරෙත්.

සමහර නිපාතයෝ අන්‍යාර්ථ ප්‍රකාශකෙරෙත්.

කිසි නිපාතයෙක් අර්ථ ප්‍රකාශයක් නොමැතිව පදපිරවීම පිණිස යෙදෙත්.

(1) විසිතුරු අර්ථ ප්‍රකාශකරන නිපාතපද.

සමුච්චයාර්ථයෙහි (කැටිකිරීමෙහි)- සහ, හා, ද, ත්, ආදියයි

ඛේදාර්ථයෙහි (දුක ප්‍රකාශකිරීමෙහි)- අනේ, අහෝ, අඳෝ, ආදියයි

ප්‍රශ්නාර්ථයෙහි (පිළිවිසීමෙහි)- කිම්, ද, ඇයි, ආදියයි

අනියමාර්ථයෙහි (අනුමානයෙහි)- හෝ, නොහොත්, එක්හෝ, නම්, ආදියයි

ශ්‍රැති ශුවනයෙහි (කිංදය ඇසීමෙහි)- ලු, ලූ, ආදියයි

අවධාරණයෙහි (නිශ්චයකිරීමෙහි)-ම, ව, ආදියයි

කාලාර්ථයෙහි (කල්දක්වීමෙහි)- දැන්, අද, එදා, ආදියයි.

තුල්‍යාර්ථයෙහි (සමානකම පෙන්වීමෙයි)-මෙන්, වැන්, සේ, එව්, නිසි, ආදියයි.

කර්මාර්ථයෙහි (කර්මය දක්වීමෙහි)- විනා, මිස, හැර, ආදියයි.

කර්ත්‍රර්ථයෙහි (කර්තෘ දක්වීමෙහි)- විසින් *
ආදියයි.

කරණාර්ථයෙහි (උපකාරවන්නක් පෙන්වීමෙහි) විසින්, කරණකොට ආදියයි.

සම්ප්‍රදානාර්ථයෙහි (කාරණය දක්වීමෙහි)- පිණිස, වස්,ව, ආදියයි.

අවධි අර්ථයෙහි (ඉම දක්වීමෙහි)- තෙක්, දක්වා, තුරු, ආදියයි.

ආධාරාර්ථයෙහි (දරන්නා පෙන්වීමෙහි)- කෙරෙහි, කෙරේ, ආදියයි.

ආමන්ත්‍රණාර්ථයෙහි (කථාකිරීමෙහි)- හෙ, එම්බා, එම්බල, කොල, බොල, ආදියයි.

නිශ්චයාර්ථයෙහි (පදකෙළවර දක්වීමෙහි)- ය. ආදියයි.

සම්බන්ධාර්ථයෙහි (වාක්‍යයන් ඈඳීමෙහි)- යි. ආදියයි.

විස්මයාර්ථයෙහි (පුදුමය ඇඟවීමෙහි) ඔහෝ, හා, අහා, ආදියයි.

පුනර් පුනාර්ථයෙහි (නැවත නැවතයන්නෙහි) සල, වැලි, පුන, පන, යොර යොර ආදියයි.

ශීඝ්‍රාර්ථයෙහි (ඉක්මන දක්වීමෙහි) වහා, තුමුටු, සහසා, විස්සල් ආදියයි.

නිරන්තරාර්ථයෙහි (නිතරයනු දක්වීමෙහි) නිබද, නිති, නිතර, අනුබද, සතත ආදියයි.

චිරකාලාර්ථයෙහි (බොහොකල් දක්වීමෙහි) සැර ආදියයි.

2. අන්‍යාර්ථ ප්‍රකාශකරන නිපාතපද.

ප්‍රතිෂේධයෙහි (නැතිකිරීමෙහි) අ, න, නො ආදියයි.

---

* 35 වෙනි සූත්‍රය බලනු.

3. පද පිරවීමපිණිස යොදන නිපාතපද.

පද පූරණාර්ථයෙහි–පු, හු, වනාහි, කලී ආදියයි.

13. උපසර්ග, නිපාත යන දෙකොටසට අව්‍යය පදයයිද කියනුලැබේ.

වියදම්නොවන්නේ අව්‍යයනම්වේ. නාමාඛ්‍යාත පදපමණ වාක්‍යසම්පාදනයෙහි ඒවා නොගැනෙන හෙයින් ඒ නාමය දීතිබේ. ඒවා ලිඞ්ග විභක්ත්‍යාදිය භජනය නොකෙරෙති.

14. ප්‍රකෘතියක් ආශ්‍රයකොට හෝ නොකොට පද සිඩවීම පිණිස ඇනම් වචනයන්ගේ වැටීම **නිපාතන** යයි කියනු ලැබේ. ඒ එක්තරා ව්‍යාකරණ විධියක්මිස අව්‍යයන්ට යෙදූ නාමයක්යයි නොසිතියයුතු· ගෞරවාර්ථයෙහි ගෝමි, හාමි, පා, ගොඤ්, වහන්දෑ ආදී ශබ්ද වැටී සඳ**ගෝමි**, රාළ**හාමි**, රතැසි**පා**, බුදු**ගොඤ්** මව්**වහන්දෑ** ආදිපද සිද්ධවීම් ඊට නිදර්ශනයි.

———o———

## 2 වෙනි අභ්‍යාස පාඨය.

1. අර්ථය අලඞ්කාරකරන උපසර්ග පසක් උදාහරණ සහිතව දක්වනු.

2. නි, දු, පර, අ, අව යන උපසර්ගපද අන්‍යපද හා ගළපා අර්ථදක්වනු.

3. යව්, පැසුලු, නිකුත්, වෙන, ඉරා, නා, කී, යන නිපාතපද කුමනඅර්ථයෙහි යෙදෙත්දැයි උදාහරණ සහිතව පෙන්වනු.

4. අගට නිපාතපදයෙදුණු වචනපසක් ලියනු.

———oo———

## 11 විභක්ති.

### Case Terminations.

———oo———

15. නාමයකින් පරවසිට ප්‍රථමාවිභක්තිය කර්ම විභක්තිය යනාදිවශයෙන් අර්ථ විභාගකරන ප්‍රත්‍යයාක්ෂර විභක්තිනම්.

විභක්තිප්‍රත්‍යය අකුරු එකකින් හෝ කීපයකින් යුක්තවේ.

"මිනිස්" යන ශබ්දයට "ආ" ප්‍රත්‍යයවැටී මිනිසා කියා ප්‍රථමාවිභක්ත්‍යර්ථයද, "ාගේ" ප්‍රත්‍යයවැටී මිනිසාගේ කියා සම්බන්ධ විභක්ත්‍යර්ථයද ආදිවශයෙන් විභක්තිවලින් ශබ්ද නානාර්ථවලට බෙදනු ලැබෙත්.

16. විභක්ති ප්‍රථමා, කර්මාදිවශයෙන් නවවැදෑරුම් බැවිද, නාමශබ්ද ඒ ඒ විභක්තිවලට වරනැගෙන හැටිද මීටප්‍රථම ග්‍රන්ථයක දක්වා ලද්දේය. ඒ විභක්තිවල විශෙෂවිභාග මෙහි දක්වන්නෙමු.

## 1. ප්‍රථමා විභක්තිය.

17. කර්ම, කර්තෘ, කරණ ආදින්විසින් නොවෙසෙසතලද අර්ථමාත්‍රය කිවමනානැත ඒ **ප්‍රථමාවිභක්තිය** භජනයකෙරේ*

ඒ අර්ථමාත්‍රය ලිඩ්ගාර්ථයයිද කියනුලැබේ. "මිනිසා," "ගැහැනී" යනු කර්ම, කර්ත්‍රාදි යම්කිසි විශේෂයක් නොදක්වන ලිඩ්ගාර්ථ වචනවෙති. එබැවින් ඒවා ප්‍රථමා විභක්තිය භජනයකෙරෙති.

කර්තෘ, කර්මයනු කර්තෘවිභක්ති කර්මවිභක්තියයි නොසිතියයුතු. කර්තෘ,කර්මයන දෙදෙනවාක්‍යයක අවසානක්‍රියාව හා බැඳෙනකල ඒවා කර්තෘ, කර්ම විභක්ති භජනය නොකෙරෙති. ඒක්‍රියාවෙන් උක්තවන හෙවත් කියවෙන කර්තෘ කර්ම අර්ථමාත්‍රශබ්දද ප්‍රථමා විභක්තිය භජනය කෙරෙති.

18. ප්‍රථමාවිභක්ති එකවචනයට අ, ආ, උ, ඒ අක්, එක් යන ප්‍රත්‍යයෝද බහුවචනයට උ, ඕ, හු වල් යන ප්‍රත්‍යයෝද යෙදෙත්.

---

*උක්තාර්ථයෙහි හා ලිඩ්ගාර්ථයෙහියි දෙයාකාරයක ප්‍රථමාවිභක්තිය යෙදේයයි කිසිවෙක් සලකති.

උදාහරණ:–

| | එකවචන. | | බහුවචන. |
|---|---|---|---|
| අ. | වත දිලිසේ. | උ. | මොනරු ඉගිලෙති. |
| ආ. | ශොනා තණකයි. | ඕ. | ගොවියෝ විවපුරති |
| උ. | "කුමරු සච්සතු ගෙවා දූතගති" | හු. | වෙළඳහුදනසපයති. |
| ඒ | කළේ බිඳුණේය. | වල්. | ගෙවල් බිඳවැටෙති. |
| අක් | කතක් පතිදම්රකී. | | |
| එක්. | රජෙක් නුවර වසයි. | | |

**සැලකියයුතුයි.** (1) ප්‍රථමාවිභක්තිය **න, ණ්, උණ්** යන ප්‍රත්‍යයන්ද අනියමින් ගන්නාබැව් පුරාණ පොතපතින් පෙනේ. **න.** "මහසහ**න**මනුවණවණති" අණ්. "පරසතු**රණ්**එති"

උණ්. "වේසෙත් ගැනුන් නොතිත්වීමෙන්" යන පාඨ ඊට නිදර්ශනයි. නුමුත් මේව්‍යවහාරය ව්‍යක්ත භාෂායෙහි ඇතත් ඉතාම විරලය.

(2) ප්‍රථමා පුරුෂලිඞ්ග එකවචනාර්‍ථශබ්දයට පරව **තෙම, තෙමේ** හා ස්ත්‍රීලිඞ්ග එකවචනාර්‍ථශබ්දයට පරව **තොම, තොමෝ** යනුද, ලිඞ්ගද්වයෙහිම බහුවචනාර්‍ථ ශබ්දයට පරව **තුමු** යනුද කිසිවිටක යොදත්. රජතෙම, රජතෙමේ, මෙහෙසී තොම, මෙහෙසී තොමෝ, කුමාරයෝතුමූ, කුමාරියෝතුමූ යනු ඊට නිදර්ශනයි.

———oo———

## 3 වෙනි අභ්‍යාස පාඨය.

1. මොනර, දෙමළ, බමුණු, කුමරී, පුටු යන ශබ්දවලැ ප්‍රථමාවිභක්ති බහුවචන කර්‍තෘකාරක ක්‍රියා සමග යොද වාක්‍යපහක් තනනු.

විභක්තිප්‍රත්‍යය අකුරු එකකින් හෝ කීපයකින් යුක්තවේ.

"මිනිස්" යන ශබ්දයට "අ" ප්‍රත්‍යයවැටී මිනිසා කියා ප්‍රථමාවිභක්ත්‍යර්ථයද, "ආගේ" ප්‍රත්‍යයවැටී මිනිසාගේ කියා සම්බන්ධ විභක්ත්‍යර්ථයද ආදිවශයෙන් විභක්තිවලින් ශබ්ද නානාර්ථවලට බෙදනු ලැබෙත්.

16. විභක්ති ප්‍රථමා, කර්මාදිවශයෙන් නවවැදෑරුම් බැවිද, නාමශබ්ද ඒ ඒ විභක්තිවලට වරනැගෙන හැටිද මීටප්‍රථම ග්‍රන්ථයක දක්වනලද්දේය. ඒ විභක්තිවල විශේෂවිභාග මෙහි දක්වන්නෙමු.

### 1. ප්‍රථමා විභක්තිය.

17. කර්ම, කර්තෘ, කරණ ආදීන්විසින් නොවෙසෙසනලද අර්ථමාත්‍රය කිවමනාතැන ඒ ප්‍රථමාවිභක්තිය භජනයකෙරේ*

ඒ අර්ථමාත්‍රය ලිඞ්ගාර්ථයයිද කියනුලැබේ. "මිනිසා," "ගැහැනී" යනු කර්ම, කර්ත්‍රාදි යම්කිසි විධානක් නොදක්වන ලිඞ්ගාර්ථ වචනවෙති. එබැවින් ඒවා ප්‍රථමා විභක්තිය භජනයකෙරෙති.

කර්තෘ, කර්මයනු කර්තෘවිභක්ති කර්මවිභක්තියයි නොසිතියයුතු. කර්තෘ,කර්මයන දෙදෙනවාක්‍යයක අවසානක්‍රියාව හා බැඳෙනකල ඒවා කර්තෘ, කර්ම විභක්ති භජනය නොකෙරෙති. ඒක්‍රියාවෙන් උක්තවන හෙවත් කියවෙන කර්තෘ කර්ම අර්ථමාත්‍රශබ්දද ප්‍රථමා විභක්තිය භජනය කෙරෙති.

18. ප්‍රථමාවිභක්ති එකවචනයට අ, ආ, උ, ඒ අක්, එක් යන ප්‍රත්‍යයෝද බහුවචනයට උ, ඕ, හු වල් යන ප්‍රත්‍යයෝද යෙදෙත්.

---

*උක්තාර්ථයෙහි හා ලිඞ්ගාර්ථයෙහියි දෙආකාරයක ප්‍රථමාවිභක්තිය යෙදේයයි කිසිවෙක් සලකති.

උදාහරණ:-

| එකවචන. | | බහුවචන. | |
|---|---|---|---|
| අ. | **වන** දිලිසේ. | උ. | **මොනරු** ඉගිලෙති. |
| ආ. | **ගොනා** තණකයි. | ඕ. | **ගොවියෝ** විවපුරති |
| උ. | "**කුමරු** සව්සතු ගෙවා දූතගති" | හු. | **වෙළඳහු**දනසපයති. |
| ඒ | කලේ බිඳුණේය. | වල්. | **ගෙවල්** බිඳවැටෙති. |
| අක් | **කතක්** පතිදම්රකී. | | |
| එක්. | **රජෙක්** නුවර වසයි. | | |

**සැලකියයුතුයි.** (1) ප්‍රථමාවිභක්තිය **න, ණ්, උණ්** යන ප්‍රත්‍යයන්ද අනියමින් ගන්නාබැව් පුරාණ පොතපතින් පෙනේ. **න.** "මහසහ**න**මනුවණවණති" **අණ්.** "පරසතු**රණ්**එති"

**උණ්.** "වේසෙන් ගෑනුන් නොතිත්විමෙන්" යන පාඨ ඊට නිදර්ශනයි. නුමුත් මේව්‍යවහාරය ව්‍යක්ත භාෂාසෙහි ඇතත් ඉතාම විරලය.

(2) ප්‍රථමා පුරුෂලිඞග එකවචනාර්ථශබ්දයට පරව **තෙම, තෙමේ** හා ස්ත්‍රීලිඞග එකවචනාර්ථශබ්දයට පරව **තොම, තොමෝ** යනුද, ලිඞගද්වයෙහිම බහුවචනාර්ථ ශබ්දයට පරව **තුමූ** යනුද කිසිවිටක යෙදත්. රජතෙම, රජතෙමේ, මෙහෙසී තොම, මෙහෙසී තොමෝ, කුමාරයෝතුමූ, කුමාරියෝතුමූ යනු ඊට නිදර්ශනයි.

---

### 3 වෙනි අභ්‍යාස පාඨය.

1. මොනර, දෙමළ, බමුණු, කුමරී, පුටු යන ශබ්දවලැ ප්‍රථමාවිභක්ති බහුවචන කර්තෘකාරක ක්‍රියා සමග යොද වාක්‍යපහක් තනනු.

2. ළිත්, පොලොං, මැණික්, උමං, බලල් යන ශබ්දවලැ ප්‍රථමාවිභක්ති. එකවචන කර්මකාරකක්‍රියා සමගයොදා වාක්‍ය පහක් සාදනු.

## 2. කර්මවිභක්තිය.

19. කර්තෘහුගේ ක්‍රියාව හා යුක්තවන නොහොත් කර්තෘහුගේ ක්‍රියාවට යටත්වන පදාර්ථය කර්මවිභක්තිය භජනයකෙරේ.

වඩුවා "පුටුව" සාදයි.

මෙහි "සාදයි" යන සකර්මක ක්‍රියාව හා යුක්ත වන නොහොත් ඊට යටත්වන පදාර්ථය දක්වන නාම පදය "පුටුව" යි. ඒනිසා "පුටුව" යන පදය කර්මවිභක්තිය භජනය කෙරේ.

20. කර්මවිභක්ති එකවචනයට අ, ආ, උ, හු ට, අකු, අක් යන ප්‍රත්‍යයෝද, බහුවචනයට අන්, ආන, උන්, න, න්, නන්, නට, වල් යන ප්‍රත්‍යයෝද යෙදෙත්.

උදාහරණ- එකවචන බහුවචන

| එකවචන | බහුවචන |
|---|---|
| අ- ළමයා **පොත** කියයි. | අන්-අපි **දෙවියන්** වඳිමු. |
| ආ- නයා **මැඩියා** ගිලියි. | ආන- **කිරලාන** නොමරව්. |
| උ-සෙනෙවියා **අසුමෙහෙයී**. | උන්-**ඥගුරුන්** පුදව්. |
| හු-සතුරෝ **රජහු** මැරූහු. | න-සිය **සුතන** සුරකිව්. |
| ට -ඈ **ගෙට** ගියාය. | න්-**ඉනිරින්** සතරෙහි යොදමු. |
| අට-මගියා **ගමට** එයි. | වල්- මිනිස්සු **ඇලවල්** කපති. |
| අකු-දිවියා **ගොනකු** මැරී. | නන්-දූහුනෝ **සේනන්** සොයති. |
| අක්-ඇමතියා **වරයක්** ලදී. | නට-නිසරු **විල්නට** වදිත් |

21. කර්තෘහුගේ ක්‍රියාව හේතුකොටගෙන අමුතුව යමක් හටගැනේනම් ඒ නිර්වර්ත්‍ය කර්මයයි කියනු ලැබේ.

උදා:—කොල්ල පැදුරක් වියයි; කුමරිය පුතකු වැදුවා.

මෙහි පැදුරක්, පුතකු යන පදවලින් පළමු නොතිබුණුද ක්‍රියාව හේතුකොට උපදනා හෙයින් ඒ නිර්වර්ත්‍ය කර්මයි.

22 කර්තෘහුගේ ක්‍රියාව හේතුකොටගෙන යමක් වෙනස් බවට පැමිණේනම් ඒ විකාර්‍ය කර්මයයි කියනු ලැබේ.

උදා:—උයන්ගොව්වා ගොම හළුකළේය. අරක්කැමියා බත පිසයි.

මෙහි ගොම වෙනස්බවට පැමිණ හළු වීමද, සහල් වෙනස්බවට පැමිණ බත වීමද ඇතිවනහෙයින් හළු සහ බත යනු විකාර්‍ය කර්මයි.

23. යම් කර්මයෙක් නිර්වර්ත්‍ය, විකාර්‍ය දෙකට අයිති නොවන්නේ හුදෙක් කර්තෘහුගේ ක්‍රියාව හා සම්බන්ධවේනම් ඒ ප්‍රාප්‍ය කර්මයයි කියනු ලැබේ.

කර්තෘහුගේ ක්‍රියායෙන් හටගත් විශේෂයෙක් කර්මයෙහි ප්‍රත්‍යක්ෂයෙන් හෝ අනුමානයෙන් දර්ශනය නොවන්නේද ප්‍රාප්‍යනම්.

උදා:— හඳ බලමු; කොළඹයෙති

මෙහි බලමුයන ක්‍රියාවෙන් හඳේ විශේෂ සිද්ධියක් හෝ යෙති යන ක්‍රියාවෙන් කොළඹෙහි විශේෂ සිද්ධියක් නොදන්නා ලබන හෙයින් හඳ, කොළඹ යනු ප්‍රාප්‍යකර්මයි. නිර්වර්ත්‍ය, විකාර්‍ය යන දෙකට ඇතුළත් නොවන සියලු කර්මයෝම ඇතම් සියුම් වෙනස්කම් ඇතත් ප්‍රාප්‍යයෙහිම ගිනිය යුත්තෝය.

**24. අත්‍යන්ත සංයෝගයෙහි** (අසන්තයෝගී) ද කර්ම විභක්තිය යෙදේ.

ක්‍රියා ගුණ ද්‍රව්‍ය යන මොවුන්ගේ කාලමාර්ග යන දෙදෙනා හා ඇති නිරන්තර සම්බන්ධය අත්‍යන්ත සංයෝග නම්.

උදාහරණ:—

**සතියක්** දන්දුනිමි. (කාල ක්‍රියා දෙදෙනාගේ සම්බන්ධය)
**ගව්වක්** කතාව කීවෙමි. (මාර්ග ක්‍රියා ,, ,, )
**සමසක්** නියහයි. (කාල, ගුණ ,, ,, )
**සැතැප්මක්** වක්වූඔයයි (මාර්ග, ගුණ ,, ,, )
**මසක්** බෙහෙත් කෑමයි (කාල, ද්‍රව්‍ය ,, ,, )
**යොදුනක්** වනයයි (මාර්ග, ද්‍රව්‍ය ,, ,, )

මෙහි "සතියක් දන්දුනිමි" යන්නෙන් සතියක් මුළුල්ලේ අතරක් නැතිව නොකඩව දන්දුන් බවක් ප්‍රකාශවේ. සතියක් යන කාලය දුනිමි යන ක්‍රියාව හා සම්බන්ධ කිරීමෙන් නොකඩව පැවැත්ම අදහස්කරන් ලදී. සතිසතුල කඩින්කඩ දන්දීම කළබව දක්වුව මනාතැන "සතියෙහි" කියා ආධාර විභක්තියෙහි යෙදිය යුතුවේ. ගව්වක් ආදි අවශෙෂ ශබ්දයන්ගේ යෙදීම්ද මෙනයින් සැලකියයුතු.

25 ඉත්ථම්භූතාඛ්‍යානයෙහි (ඉතිබූඅරුත්හි) ද කර්ම විභක්තිය යෙදේ. ඉත්ථම්භූත යනු මෙසේ වියයන අර්ථයි. යම් පැවැත්මක් පළමු තුබූ ප්‍රකාරය හැර අන්‍ය ප්‍රකාරයකට පැමිණේද ඒ ඉත්ථම්භූත නම්වේ.

උදා:— අකිකරු පුතා **පියාට** හොඳවිය.

මෙහි පුතා පියාට කලක් අමනොඳවසිට පසුවම නොඳවූබැව් ප්‍රකාශවේ. පියාගේ පළමුපැවැත්ම වෙනස්වීමෙන් හටගත්අන්‍යපැවැත්ම ඉත්ථම්භූතහෙයින් පියාටයනු ඉත්ථම්භූතාඛ්‍යානයෙහි කර්මවිභක්තියවේ.

26. විනායෝගයෙහිද කම්මවිභක්තිය යෙදේ.

වර්ජනාර්‍ථවූ විනායන නිපාතයා යෙදීම විනායෝගයනම්. විනායන නිපාතය හා සම්බන්ධවනපදය කම්මවිභක්තිය ගනී.

උදා:- බුදුනන් විනා දහමට කවුරු ගරහත්ද?

විනායන අර්‍ථයෙහිවූ මුත්, මිස, හැර යනාදි වෙනත් නිපාතයන් හා යෙදෙන ශබ්ද කර්‍මවිභක්තිය භජනය කෙරෙත්.

උදාහරණ:-

මුත් -නොපමුන් කවරෙක් මට පිටුවහල්ද?

මිස -කැඳ මිස බත් ලෙඩුට නොහොබී.

හැර-ඉසිවනුන් හැර අවැඩකරු වෝ කවරහුද?

27. සමානාර්‍ථයෙහි මෙන්, සේ, වැනි, ලෙස ආදි නිපාත හා සම්බන්ධවන ශබ්ද කර්‍මවිභක්තිය භජනය කෙරෙත්.

උදාහරණ:-

මෙන්-දත් කොඳ කැකුළුමෙන් බබලත්.

සේ -"ගොසකු සේ බඩගාතොයව."

වැනි -"කෙසරපෙල වැනි දුවනහයරල"

ලෙස -හෙනෙව මා පුතකු ලෙස රැක්කේයි.

28, අරබයා, සඳහා, උදෙසා, නිසා ආදි පූර්‍ව ක්‍රියාවාචි නිපාතපදයන් හා සම්බන්ධවූ ශබ්ද කම්ම විභක්තිය ගනිත්.

උදාහරණ:-

අරබයා-"උකටලී මහණකු අරබයා මේ වදාළ සේක"

සඳහා -"සතුන් සඳහා විදුනා සසරදුක්"

උදෙසා -"කොනනක පිදුවත් මුනිඳුන් උදෙසා"

නිසා -"මෙදුවූ මූසිලයා නිසා"

**29.** **සමීපාර්ථ** කරශබ්දයා කෙරෙත්ද කර්ම විභක්තිය යෙදේ.

උදා:- **මහතුන්** කරා එළඹ සිටියේය.

30. ප්‍රයෝජ්‍යක්‍රියාවේදී ලවායන්න හා සම්බන්ධ වන්නද කර්මවිභක්තිය ගනී.

උදා:- ගුරුවරයා **අනවැසියා** ලවා පොත ලියවයි.

31. **සම්ප්‍රදානාර්ථයෙහිද** කර්මවිභක්තියයෙදේ.

උදා:- **මට** ඉවසුව මැන.

මෙහි ඉවසීම ලබන්නේ "මට" යන්නවුවත් මා ඉවසුව මැනයන අර්ථයෙහි **මට** යන්න කර්මවිභක්තියෙහිවේ.

32. ආධාරාර්ථයෙහිද කර්මවිභක්තිය යෙදේ.

(1) පසු කිරිය කරන්නහුගේ ක්‍රියාවට පෙර කිරිය ආධාරවන කල්හි ඒ පෙර කිරිය කරන්නා කර්ම විභක්තියෙන් සිටී.

උදා:— **හිමියා** නුවරට යාදී බිරිඳ සැඟවී ගියාය.

මෙහි කාලාර්ථ වාචි දී ප්‍රත්‍යයවත් **යා** යන පූර්ව ක්‍රියාවෙන් දක්වන හිමියාගේ ක්‍රියාව බිරිඳගේ සැඟවී යාමට ආධාරවිය. එබැවින් **යා** යන පූර්ව ක්‍රියාව කරන කර්තෘ ආධාරාර්ථයෙහි කර්මවිභක්තිය ගන්නා බැව් සලකනු ලැබේ.

(2) කාලාත්‍යයේ අසම්භාව්‍ය ක්‍රියාව කරන්නාද කර්ම විභක්තියෙන් සිටී.

උදා:— "කියත **ඔහු** මෙතෙප ල
ආයෙය ඇඳුරු ගුත්ති ල"

මෙහි කියතයන කාලාත්‍යයේ අසම්භාව්‍ය ක්‍රියාව කරන කර්තෘවූ "ඔහු" යන්න ආධාරාර්ථ කර්මවිභක්තිය ගන්නා බැව් සලකනු ලැබේ.

### 4 වෙනි අභ්‍යාස පාඨය.

1. හු, ට, නට, ආන, න, යන ප්‍රත්‍යයන්යොදා කර්මවිභක්ත්‍යන්ත ශබ්ද තුන තුනබැගින් දක්වනු.

2. ද්විතීය, විකාර්ය යන කර්මභෙදයන්ට උදාහරණ පහ පහ බැගින් දෙනු.

3. කාල හා ද්‍රව්‍යද, මාර්ග හා ගුණද සම්බන්ධවූ අත්‍යන්ත සංයොගයෙහි කර්මවිභක්තියට උදාහරණ හතරක් ලියනු.

4. මෙහිපහත දක්වන පාඨවල ඇති කර්මවිභක්ත්‍යන්තපද වෙන්කොට ඒවා මොන අර්ථයන්හි යෙදී ඇත්තාහුදැයි පෙන්වනු.

(1) ලෙඩුට බෙහෙත් හොඳවිය. (2) රජකුතබා ඒසියයක් රජුන් විසිනුදු පැරදවිය නොහැක. (3) නුවන් ඉඳුවරවන්. (4) මසක් ගමන්කෙළෙමි. (5) විරුදු මූසිලයා සඳ පසිඳුවිය. (6) කුකුළා හඬලද්දී ගෙදර ආවෙමි. එඬේරා වැඩකරුවාලවා ගොනුන් තණකවයි.

———oo———

### 3. කර්තෘ විභක්තිය.

33. මෙහෙයීමක් නොලබා හෝ ලබා ක්‍රියාව කරන්නේ කර්තෘනම්වේ. කර්තෘතෙමේ **ශුද්ධ කර්තෘය**, **හෙතු කර්තෘය**, **කර්ම කර්තෘය**යි තුන්වැදෑරුම්වේ.

(1) ක්‍රියාවකරන තැනැත්තේ ශුද්ධකර්තෘ නම්.

උදා:— **හොරා**ගත්බඩු; **දාසයා** ලවා කෙරෙව් වැඩේ.

(2) ක්‍රියාවකිරීමට මෙහෙයන තැනැත්තේ හෙතු කර්තෘ හෙවත් ප්‍රයොජක කර්තෘනම්.

උදා:— **මහත්මයා** දාසයාලවා පිසෙවූ බත

(3) ක්‍රියාව කරගන්නේ කර්මයම වූකල ඒ කර්ම කර්තෘ නම්.

උදා:— **ගඟ** වැටී සිදුවූදේ.

**34.** ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි නොයෙදෙන ශුද්ධ කර්තෘද, අවසාන ක්‍රියාව හා නොබැඳෙන ශුද්ධකර්තෘ, හේතුකර්තෘ හා කර්මකර්තෘද කර්තෘවිභක්තිය භජනය කෙරේ.

කර්තෘවිභක්ති එකවචනයට අ, ආ, උ, හු, අකු අක් යන ප්‍රත්‍යයෝද

බහුවචනයට අන්, ආන, උන්, න, න්, නන්, වල් යන ප්‍රත්‍යයෝද යෙදෙත්.

මිටයෙදෙන්නේ ට, නට, හැර කර්මවිභක්තියට අයත් ඉතිරි ප්‍රත්‍යයෝම වෙති.

උදාහරණ:—

| එකවචන. | බහුවචන. |
|---|---|
| අ– **ශිමුඳුව** දුන් මාලය අනගියි. | අන්– **දිවියන්** මැරූ ගව යෝ බොහෝයි. |
| ආ– **මොනරා** මැරූ නයා කෝ. | ආන– **ගුරුළාන** ගත් නයින් දුටිමු. |
| උ– **කුමරු** ගත් කඩුව බැබලුණි. | උන්– **බිළිඳුන්** කළුවරද නොගනිව්. |
| හු– **රජහු** දුන් අණ යහපති. | න– **පිළිමල්න** නොගත් නුවර කොයේකද? |
| අකු– ගැහැනියකු කළිනපුර බලව්. | න්– **පඬින්** ගෙතූගත් පවතිත්. |
| අක්– **ගසක්** වැටී ගෙයක් කැඩුණේයි. | නන්– **සේනන්** කළුවහර නොළඟිනු. |
| | වල්– **ඔයවල්** ගලා කුඹුර යටවිය |

35. කිසිවිටෙක කර්තෘවිභක්තියටපරව "විසින්" යනු යෙදේ. මේ වනාහි මාගධ වස ශබ්දයෙන් බිඳුණු "විසි" යන තද්භව ශබ්දයාකෙරෙන් "න්" ප්‍රත්‍යව සිද්ධවූ නාමපදයෙකැයි ඇතම් ආචාර්‍ය්‍ය කෙනෙක් කියත්. විසින් යන්නෙන් වසිභාවය කර්තෘ කෙරෙහිම පිහිටිබව දක්වයි.

36. හා, සහ, සමග, කැටුව ආදි නිපාතයන් හා සම්බන්ධවන නාමපදද කර්තෘවිභක්තිය භජනයකරත්.

උදාහරණ:—

හා –"මොහු හා වාදනොතරමි."

සහ –"සුරන් සහ සහසැස්.
නොකර සිටියේ අහස් කුසහිස්."

සමග–"දිනමින් සමග ගෙවුනෙය දවහල් දවස"

කැටුව–ශිවරගසෙන් කැටුව යුදට නික්මිණ.

කිසිතැනෙක හා සමග යනු එකටයෙදේ. බෙබද්දන් හා සමග මම නොයමි යනු ඊට නිදර්ශනයි.

37. හා සම්බන්ධ තුල්‍යාර්ථයෙහිද කර්තෘවිභක්ත්‍යය යෙදේ.

උදා:– මෙතෙම මට පුතකු හා සමානය.

—— 888 ——

## 5 වෙනි අභ්‍යාස පාඨය.

1. කර්තෘවිභක්තිය භජනයකරන ශුද්ධකර්තෘ, හෙතුකර්තෘ, කර්මකර්තෘ යන තුනට උදාහරණ තුන තුන බැගින් දෙනු.

2. අකු, අක්, නන්, වල් යන ප්‍රත්‍යයාන්ත ශබ්ද හතරක් යොදා වාක්‍යහතරක් තනනු.

3. හාසම්බන්ධ තුල්‍යාර්ථයෙහි කතෘවිබතට නිදර්ශන තුනක්දෙනු.

4. පහත දක්වන වාක්‍යයෙහි ඇති කර්තෘවිභක්ත්‍යන්ත පද වෙන්කර පෙන්වනු.

දුදනන් හා හැසිරෙන කිසිවෙකු කරනවැඩකට මිහතුන් අනුබල නොදිය යුතුයි.

---

## 4. කරණවිභක්තිය.

38. ක්‍රියා සම්පාදනය පිණිස කර්තෘහට ඉතා උපකාරවත්තක් කරණ විභක්තියෙහි යෙදේ.

මෙහි එකවචන බහුවචන දෙකටම ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි යන ප්‍රත්‍යයෝ සමව යෙදෙත්.

උදාහරණ:—

ඉන්- මම ගිසනින් නොයමි.
ඉනි- නැණිනි දියුණුවවි.
එන්- ගුණෙන් ලෙවන්සිත් ගනිවි.
එනි- ඔහු යත්නේ විජයෙනි.
නෙන්-නැණ්නෙන් දන සපයවි.
නෙනි-රුපුන් දිනියයුත්තේ මෙන්නෙනි.
නි- සහතොස්නි දවසරිවි.

39. සප්‍රාණි ශබ්ද මෙම විබතෙහි යෙදෙනකල කරණකොට යනු ම හොමැති කර්මවිභක්ත්‍යන්ත පදයට පරව වැටේ. එය ප්‍රකෘතියෙන් පරවද කිසි තැනක එකවචනයෙහි දක්නාලැබේ.

බිසව කරණකොට, බිසවුන් කරණකොට, එළදෙන් කරණකොට යනු ඊට නිදර්ශනයි.

40. ට, නට නොමැති කර්මවිභක්ත්‍යන්ත සප්‍රාණි ශබ්දයන්ට පරව ගෙන් යනු යෙදීමෙන් කරණ විභක්ත්‍යන්ත පද කිසිවිටෙක සෑදෙත්.

උදාහරණ:— සිහසුන **රජුගෙන්** බබලයි. සත් සල **උගතුන්ගෙන්** හෙබිණි.

41. ඇතම් අචේතන ශබ්දයන්ට කරණවිභක්ති ප්‍රත්‍යයන් යෙදීමට ප්‍රථම බහුවචන "වල" යන්නද යෙදියයුතුවේ. පොරෝවලින්, ගස්වලින් යනු ඊට නිදර්ශනයි.

42. "විසින්" යන්න කිසිතැනෙක කරණාර්ථ යෙහි යෙදේ.

"ඔහු විසිකළ විසි න්
සමග විසුවා හිමිට රහසි න්

මෙහි "විසිකළ විසින්" යනු වසඟකරනු ලැබීම කරණකොට යන අර්ථයි. එබැවින් විසින් හා සම් බන්ධවන විසිකළ යන්න කරණවිභක්ත්‍යන්ත පදයකි.

සංඛ්‍යාපවිසින්, විස්තරවිසින් යන පාඨද මිශ්‍ර සිංහල පොත් පත්වල පැනේ.

43. **කාලාර්ථයෙහිද** කරණවිභක්තිය යෙදේ.

උදා:— තෙදිනකින් වැඩය නිමකළේය.

මෙහි වැඩය කිරීමට කාලවශයෙන් උපකාරවූ යේ තෙදිනක් හෙයින් තෙදිනකින් යනු කරණ විභක්ත්‍යන්තයි.

44. **මාර්ගාර්ථයෙහිද** කරණවිභක්තිය යෙදේ.

උදා:— **හැතැප්මකින්** ගමන නිමකළෙමි.

මෙහි ගමන නිමකිරීමට හැතැප්මක්වූ මාර්ගය උප කාරවූහෙයින් **හැතැප්මකින්** යනු කරණවිභක්තිවේ.

45. **හෙත්වර්ථයෙහිද** කරණවිභක්තිය යෙදේ.

ඔහු **පැමිණීයෙන්** මම ගැලවුනෙමි.

හෙතෙම **දත්තෙන්** උසස්විය.

මෙහි ගැළවීමට කෙනෙකු පැමිණීමද, උසස්වීමට දනයද හෙතුවූහෙයින් පැමිණීයෙන්, දනයෙන් යනු කරණවිභක්තිවේ.

46. විශෙෂණාර්ථයෙහිද කරණවිභක්තිය යෙදේ.

උදා:—**වයසින්** බාලයෙකි.

මෙහි වයසින් යත්තෙන් බාලයෙක් වූයේ කෙලෙසදැයි වෙසෙසන හෙයින් වයසින් යනු කරණ විභක්තිවේ.

අසු **තාදින්** දුවයි යනතැන ක්‍රියා විශෙෂණවූ තාදින් යනුද කරණ විභක්ත්‍යන්තවේ.

47. **උපලක්‍ෂණාර්ථයෙහිද** කරණ විභක්තිය යෙදේ.

උපලක්‍ෂණ යනු යමක එල්බ සිටි ලක්‍ෂණයි.

උදා:— **පැසුණු හිසින්** බුහුමන් ලබව.

මෙහි බුහුමන් ලැබීමට උපකාරවත්තේ එල්බ සිටි ලක්‍ෂණයක්වූ පැසුණු හිස හෙයින් පැසුණු හිසින් යනු කරණවිභක්තිවේ.

48. යුක්තාර්ථ යෙහිද කරණවිභක්තිය යෙදේ.

උදා: — ගස **මල්පල්ලෙන්** යුක්තයි.

49. අවධිඅර්ථයෙහිද කරණවිභක්තිය යෙදේ.

උදා:— **දුසිරිතෙන්** මිදුනෙමි.

මෙහි දුසිරිතෙන් අහක්වීම කරණකොට මිදීම ඉෂ්ටවූ බැවින් දුසිරිතෙන් යනු කරණවිබත්වූවත් අහක්විමේ ඉම දුසිරිත නිසා එශ අවධි අර්ථයෙහිවේ.

———oo———

**6 වෙනි අභ්‍යාසපාඨය.**

1. ඉනි, නි, තෙන්, ගෙන් යන ප්‍රත්‍යයාන්තපද හතරක් යොද වාක්‍ය සතරක් තනනු.

2. බහුවචනයෙහි වල්යන්නයෙදී සෑදෙන කරණ විභක්ත්‍යන්ත පදසතරක් සහිත වාක්‍යහතරක් සාදනු.

3. කාල, මාර්ග, විශේෂණ, යුක්ත, උපලක්ෂණ යන අර්ථයන්හි කරණවිභක්තිය යෙදෙනහැටි නිදර්ශන වලින් පෙන්වනු.

---

## 5. සම්ප්‍රදාන විභක්තිය.

50. යමක් ලබනතැනැත්තා ප්‍රකාශකරන පදය සම්ප්‍රදාන* නම්වේ.

ඒ ලබනදෙය දනයක් හෝ, ප්‍රියකිරීමක් හෝ, දූරීමක් හෝ, ක්‍රෝධාදියක් හෝ වියහැකිය.

මෙහි එකවචනයට අට, ආට, උට, ට, හට, හුට යන ප්‍රත්‍යයෝද බහුවචනයට අන්ට, අනට, ආනට, අන්හට, උන්ට, උන්හට, න්ට, න්හට නට, නන්ට, වලට යන ප්‍රත්‍යයෝද යෙදෙත්.

උදාහරණ:—

**එකවචන.**

අට –කනට මුදුවක් දුනි. ට –කිවිට පඬුරුදෙති.

---

*සම්ප්‍රදානය අනිරාකාර්‍ය, අනුමන්තෘය, ප්‍රේෂක යයි තුන්වැදෑරුම් වේ.

(1) දනය නොවලක්වන්නේ අනිරාකාර්‍ය නම්වේ.
කුඹුරට දියදෙයි.

(2) දනය පිළිගැන්මට කැමතිවන්නේ අනුමන්තෘ නම්වේ.
බමුණාට දන්වත් දෙයි.

(3) දනය ඉල්ලා ලබාගන්නේ ප්‍රේෂක නම්වේ.
යදියාට පිළිදෙන්නේය.

| | | | |
|---|---|---|---|
| ආට | -ගොනාට පැන්දෙව්. | හට | -දූහට කුමක් දෙමුද? |
| උට | -රජුට තුතිපුදමු. | හුට | -ඇමතිහුට කුඩය ඇල්ලුවේය. |

බහුවචන.

| | | | |
|---|---|---|---|
| අන්ට | -බමුණන්ට දන් දෙව්. | න්ට | -ඉතිරින්ට දයා වව්. |
| අනට | -ගම්වැසියනට පෙම්වඩමු. | න්හට | -සිඟින්හට ගොදුරු දෙව්. |
| ආනට | -කොවුලානට කවුඩෝ කිපෙත්. | නට | -රුපුනට වැඩ පතව්. |
| අන්හට | -ගොවියන්හට වැසිපල ලැබේවා. | නන්ට | -සේනන්ට කැමති වෙමු. |
| උන්හට | -පරකතුන්හට ආලය නොවව්. | වලට | -මල්වලට පැන් ඉසිව්. |

51. පිණිස, වස් යන නිපාතයන් හා යෙදෙන පදද සම්ප්‍රදානවිභක්ති භජනය කරත්.

උදා:— පින් පිණිස දන්දේ; "පලකරනු වස් මෙ කෙලෙම්"

පිණිස නිසිතැන කිසිවිටෙක අට ආදි ප්‍රත්‍යයෝ ද යෙදෙත්.

උදා:— ඈ දරට ගියාය; දරට=දරපිණිස.
යන්ට නික්මිණි, යන්ට=යනපිණිස.

වස්යනු කිසිතැනෙක "ව" කියාද යෙදේ.

උදා:— "ලබනුව සිව්දහන්" ලබනුව=ලබනු+වස්

52. සුදුසු, සෑහීම්, ණයගිම් යනාදි අර්ථයන්හිද සම්ප්‍රදානවිභක්තිය පැනේ.

උදා:- (1) තව්සන්ට ඉවසීම සුදුසුයි.
(2) මේබත් දෙදෙනෙකුට සෑහෙයි.
(3) වෙළඳුට එහතෙම රුපියලක් ණයයි.

### 7 වෙනි අභ්‍යාස පාඨය.

1. ලට, ආනට, හට, න්ගට යන ප්‍රත්‍යයන් සහිත පද හතරක් යොදා වාක්‍ය හතරක් තනනු.

2. පිණිස යන්නට නිසිතැන සම්ප්‍රදාන විභක්තිය යෙදෙන පරිදි උදාහරණ හතරකින් පෙන්වනු.

3. දිය, සහල්, ගස්, බත් යන ශබ්ද සපදන් විභක්තිහි යොදා ඒවා සහිත වාක්‍ය හතරක් තනනු.

——oo——

### 9. අවධි විභක්තිය.

53. පහවීමේ ඉම ප්‍රකාශ කරන්නේද ක්‍රියා නැවැත්මට සීමාවන්නේද අවධි* නම්වේ.

"ගෙන්" යන්නකින්යුත් කරණවිභක්ති ප්‍රත්‍යයෝද ට, නට දෙක හැර සෙසු කර්මවිභක්ති ප්‍රත්‍යයෝද මෙහි යෙදෙත්.

උදා:—

| | එකවචන. | | බහුවචන. |
|---|---|---|---|
| ඉන් | -මගින් ඉවත්විය | නෙන් | -දිව්නෙන් වදන් උපදින්. |
| එන් | -අහසෙන්පිනි වැටේ. | වලින් | -කඳුවලින් ගල්පෙරලෙයි. |

---

* අවධි නම්වූ අපාදාන කාරකය චඤ්චල නිශ්චල වශයෙන් චලාවධිය, අචලාවධියයි දෙවැදෑරුම්වේ.

(1) චඤ්චලත්වයෙන් සිටි යමක් සීමාවන්නේ චලාවධි නම්.

දුවන අසුගෙන් මිනිහෙක් වැටේ.

(2) නිශ්චලත්වයෙන් සිට සීමාවන්නේ අචලාවධිනම්.

රුකෙන් ගෙඩියක් හිණ.

| | |
|---|---|
| නෙන් -රුක්නෙන් මල් නෙලත්. | |
| ඳගෙන් -දූෂියගෙන් කලය ගතී. | අන්ගෙන්-වෛද්‍යන්ගෙන් හානිපැමිණේ |
| ආගෙන්-හොරාගෙන් බියවේ. | න්ගෙන් -ඉතිරින්ගෙන් වියවුල් උපදී. |
| උගෙන් -සඳුගෙන් රැස් විහිදේ. | උන්ගෙන් - ගොනුන්ගෙන් ගොරොදගතී. |
| හුගෙන් -රජුහුගෙන් තෙද පැතිරේ. | නගෙන් -සපුෂ්ඵනගෙන් සුසිරි නික්මේ. |

මේ අෑ යොදනු.

54. සීමාඅර්ථවූ තෙක්, දක්වා, තුරු, පටන් යන නිපාතයන් සමග යෙදෙන ශබ්දද අවධිවිභක්තිය භජනයකරත්.

උදාහරණ:—

(1) දිනන තෙක් සටන් කරමු.
(2) වෙරළ දක්වා රැළ විහිදේ.
(3) "මා එන තුරු ඉඳුවයි පවසමින්"
(4) "සුගඳුර පටන් අඩකින් එකිනෙකට මිටි."

55. නිර්ධාරණාර්ථයෙහිද අවධිවිභක්තිය යෙදේ.

නිර්ධාරණයනු ජාති, ගුණ, ක්‍රියා සම්බන්ධ ලක්ෂණයකින් සමූහයක්හු කෙරෙන් එක්තැනැත්තකු හෝ එක්දෙයක් වෙන්කිරීමවේ.

උදා:- (1) තිරිසනුන්ගෙන් සිංහයා උතුම්. (ජාතිනිර්ධාරණය.)
(2) මැණික්වලින් රතුකැටය අනගියි. (ගුණනිර්ධාරණය.)
(3) සත්තන් අතරෙන් දුවන්නා ඉක්මණියි. (ක්‍රියානිර්ධාරණය.)

කිසි ආචාර්‍ය්‍යකෙනෙක් සංඥනිර්ධාරණයක්ද දක්මින්.

උදා:- **ශිෂ්‍යන්ගෙන්** අමරදාස සමතියි.

56. සමීපාර්ථ කර සහ වෙත් යන ශබ්දකෙරෙන් අවධිවිභක්තිය යෙදේ.

උදා:- **ගුත්තිල** කෙරෙන් මූසිලයා දුරුවිය.
**රජු**වෙතින් සෙබලා ආවේයි.

මෙහි ගුත්තිල, රජු යන පද සම්බන්ධාර්ථවුවද කර, වෙත් යන ශබ්දවලින් පරව අවධිවිභක්ති ගත් හෙයින් අවධිවිභක්ත්‍යර්ථ වේ.

---

## 6 වෙනි අභ්‍යාස පාඨය.

1. ඉනි, එනි, නෙනි, ආනගෙන්, ඉන්ගෙන්, යන ප්‍රත්‍යයන් සහිත පද යොදා වාක්‍යපහක් සාදනු.
2. චලාවධි අපාදානයට නිදර්ශන හතරක්දෙනු.
3. මෙහිපහත දක්වන වාක්‍යයෙහි ඇති අවධිවිභක්ත්‍යන්තපද වෙන්කොට ඒවා මොන අර්ථයන්හි යෙදී ඇත්දැයි කියනු.

දිවිනෙක් සුරානොබොම්යි ඉටාගත් තපස්වීන් කෙනෙකුගෙන් සතරඋගත් තරුණයෙක් ගමින් ගම යන්නේ මත්පැනින් වැලකියයුතු බැව් ගම්මුන්ට උගන්වා රාසොඩුන්ගෙන් කරදර වින්දේය.

---

## 7. සම්බන්ධ විභක්තිය.

57. අයිතිකාරයා හෝ හිමියා ප්‍රකාශකරන්නේ සම්බන්ධයි.*

---

*මේ සම්බන්ධය සෙව්‍යසෙවක රූප, ජන්‍යජනක රූප ආදි වශයෙන් අනෙකවිධ කොට සංස්කෘත මාගධී වෛයාකරණයෝ සලකති. නුමුත් හෙළුවියරණෙහි ඒ අනභිමත හෙයින් මෙහි විස්තර නොදක්වීමු.

අන්‍යොන්‍ය ප්‍රතිබද්ධවූ වස්තුදෙකකින් විශෙෂණවූ වස්තුතෙමේ සම්බන්ධයයිද කියති.

රජහුගේ පිරිසකීකල පිරිෂගේහිමියා ප්‍රකාශ කරන හෙවත් පිරිසයන්නට විශෙෂණවූ රජයන්න සම්බන්ධ නම්වේ.

සියලු සම්ප්‍රදානවිභක්ති ප්‍රත්‍යයෝද, ගෙයන්නක් සමගයෙදුණාවූද නොයෙදුණාවූද කර්‍මවිභක්ති ප්‍රත්‍යයෝද මෙහි යෙදෙත්. නුමුත් ගෙයන්න සමග ට, නට යන කර්‍මවිභක්ති ප්‍රත්‍යයෝ නොයෙදෙත්.

උදාහරණ:—

| | එකවචන. | | බහුවචන. |
| --- | --- | --- | --- |
| හට | –අස්හටඅංනැත්. | අන්හට | –**කුලුණැතියන්හට** සතුරෝකවරහුද? |
| අට | –**පාසැලට**හිමිගුරුයි. | අනට | –**ගුණැතියනට** මිතුරෝ හිඟනැත්. |
| උට | –**ඇතුට** සතුරු බාසුරුයි. | උන්ට | –**සිවලුන්ට** පියෝ ඇති. |
| අගේ | –**කානගේ** වරල මිදුණී. | අන්ගේ | –**මෙහෙලියන්ගේ** බස් නොඅදහව්. |
| උගේ | –**කුමරුගේ** කඩුව බැබලිණි. | උන්ගේ | –**එලදෙනුන්ගේ** කිරි යහපති. |
| හුගේ | –**රජහුගේ** ඇදුරු පෙරවිය. | න්ගේ | –**මුගටින්ගේ** දළ විසයි. |
| අ | –**මෙහසිය** හිමි නිරිදුයි. | අන් | –**කුකුලන්** පොරදුටිමු. |
| උ | –**සඳු** රැස් සිසිලයි. | උන් | –**සොරුන්**දන තත්වුරුනොවේ. |
| හු | –**නවසරහු** තිවෙස් අරමයි. | න් | –**ඉතිරින්** ඇස් දිගුයි. |

මේ ආ යොදනු.

අප්‍රාණික ශබ්දවල එකවචනයට ඒ ප්‍රත්‍යයක්ද බහුවචනයටආ ප්‍රත්‍යයවත් වල්යන්නද යෙදේ. ගසේ කොළ, ගස්වල කොළ යනාදිය ඊට නිදසුනුයි.

58. **සමානාර්ථයෙහිද** සම්බන්ධවිභක්තිය යෙදේ.

උදා:— ආඳ **සපුට** සමානයි.

මෙහි සපුටසමානයි යන්නෙන් සපුගේ සමානත්වය ඇතිබැව් හඟවයි.

59. **අවධිඅර්ථයෙහිද** සම්බන්ධවිභක්තිය යෙදේ.

උදා:— **චිනුන්ට** වඩා ජපන්නු වික්‍රමැතියෝයි.
**කොළඹට** මොරටුව තුන්ගව්වෙකි.
**ඉන්දියාවට** දකුණෙහි සිරිලක පිහිටියේයි.

මෙහි වික්‍රමත්වයට චීනුන් සීමාකොටගත් හෙයින්ද, දුරප්‍රමාණයට කොළඹ සීමාකොටගත් හෙයින්ද, දිශානියමයට ඉන්දියාව සීමාකොටගත් හෙයින්ද මේ තුන්තන්හිම අවධිඅර්ථයවේ.

60. පූජාබුද්ධ්‍යාදි යහපත් හිතකින් යමක්දෙනු නොලැබේනම් ඒ ලබනතැනැත්තා හඟවන නාම පදය සම්ප්‍රදානයනොව සම්බන්ධවිභක්තිය ගනී.

උදා:— **රදවාට** රෙදිදෙයි; **රජහට** දඬදේ.

—— oo ——

## 9 වෙනි අභ්‍යාස පාඨය.

1. ආ, ආගේ, හුට, අන්ට, ආන, ආනගේ, ආනට යන ප්‍රත්‍යයවත් පද යොදා වාක්‍යතතක් තනනු.

2. සමානාර්ථයෙහි සහ අවධිඅර්ථයෙහි සම්බන්ධ විභක්තිය යෙදෙන හැටි උදාහරණවලින් පෙන්වනු.

3. මෙහිපහත දක්වන වාක්‍යයෙහි ඇති සම්බන්ධ විභක්ත්‍යන්තපද වෙන්කොට ඒවා මොන අර්ථයන්හි යෙදී ඇත්දැයි කියනු.

මගියෙක් අප්‍රිකාවමැදින් යනුයේ කාපිරින්ටවඩා දරුණුවූ අරාබිසොරුන් මොරොක්කෝවට දකුණේදි මුණගැසී ඔවුන් අතතුබූ දුණුහී දක බියපත්ව එතැනට දෙගව්වක්වූ කාපිරින්ගේ ගමකට දිව ගැලවුණේය.

---

### 8. ආධාර විභක්තිය.

61. කර්තෘට හෝ කර්මයට භාරවපවත්නා ක්‍රියාව දරන්නේ ආධාර නම්වේ.

උදා:– මහතා පුටුවේ හිඳියි. (පුටුව කර්තෘහට භාර ක්‍රියාව දරයි.)

සැලෙහි බත පැසේ. (සැල කර්මයට භාරව ක්‍රියාව දරයි.)

ආධාරකාරකයවනාහි ඖපශ්ලෙෂිකය, අභිව්‍යාපකය, වෛෂයිකය, සාමීප්‍යයයි චතුර්විධවේ.

(1) එකදෙශයකින් සම්බන්ධව වැලඳගත් ආධාරය ඖපශ්ලෙෂිකාධාර නම්. මැස්සේ හිඳියි යන්නමෙනි. මෙහි හිඳීමකරන කර්තෘහට මැස්ස මුළුල්ලම වැලඳගත් ආධාරය නොවෙයි. මැස්සෙන් එකදෙශයක්ම ආධාරවේ.

2) සකල අවයවයෙහි පැතිරසිටි ආධාරය අභිව්‍යාපකාධාරය නම්.

"කිරෙහි තෙල් ඇති" යන්නමෙනි. මෙහි තෙල් ඇතිවීමට කිරෙහි සියලුකොටස්ම ආධාරවසිටි.

(3) ක්‍රියාවට විෂය (ගොචර) ස්ථානවූයේ වෛෂයිකාධාරය නම්.

"අහරෙහි ඇල්ම ඇත්තෝ" යන්නමෙනි. මෙහි ඇල්මේ පැවත්මට ගොචර ස්ථානවූයේ අහරයි.

(4) සමීපත්වයෙන් වන්නාවූ ආධාරය **සාමීප්‍යාධාර** නම්. "බිජුවපුරා වැවේ" යන්න මෙනි. මෙහි වැවක බිජුවැපිරීමක් නැතිවුවද වැවට සමීපස්ථානයෙහි එය කෙරෙනබව ප්‍රකාශවෙයි.

මෙහි එකවචනයට ඇ, ඒ, එහි, හි යන ප්‍රත්‍යයෝද බහුවචනයට අන්හි, වල යන ප්‍රත්‍යයෝද යෙදෙත්.

උදාහරණ:—

| | එකවචන. | | බහුවචන. |
|---|---|---|---|
| ඇ | -**සස්බසෑ** නිතර පව සිව්. | අන්හි | -**කෝරළයන්හි** මුදලිවරු සිටිත්. |
| ඒ | -**රමේ** රැපියෙක් වෙසේ. | වල | -**ගස්වල** කුරුල් ලෝ ලගිත්. |
| එහි | -**කෙතෙහි** ගොයම් වැඩෙත්. | වලැ | -**මල්වලැ** බමරු හැසිරෙත්. |
| හි | -**ගැල්හි** බඩු තබව්. | | |

ආධාරවිභක්තිය හඟවනපිණිස දී ප්‍රත්‍යයද කිසි තැනෙක යොදනුලැබේ.

උදා:— හෙතෙම **කොළඹදී** සිප් උගති.

62. **කාලාර්ථයෙහිද** ආධාරවිභක්තිය යෙදේ.

උදා:- සීතකරයි "**උඳුවප්** මහ **දුරුත්තේ**"

63. ආධාරවිභක්තියෙහි පැ තෙ න කෙරෙහි සහ කෙරේ සම්පාර්ථ කර ශබ්දයාට පරව එහි, ඒ යන ප්‍රත්‍යයන් යෙදීමෙන් සිද්ධවෙත්.

උදා:- **ඉසිවතුන් කෙරෙහි** කිනම් ගුණයෙක්ද? "මුන් **මා කෙරේ** පෙරේමේ" ඇත.

64. **නිර්ධාරණාර්ථයෙහිද** ආධාරවිභක්තිය යෙදේ.

උදා. **තිරිසනුන්අතරෙහි** සිංහයා උතුම්. **අතරේ** යනුදවේ.

**සිසුන්** අනරෙහි අවරදුස සමනියි, ආදිවශයෙනි.

මේ අර්ථවශයෙන් අවදි විබත්වූවද එහි, ඒ යන ප්‍රත්‍යයන් ගැනීමෙන් අදරවිබත් බවට පැමිණිතිබේ.

——oo——

## 10 වෙනි අභ්‍යාස පාඨය.

1. හි, අන්හි, වලෑ යන ප්‍රත්‍යයන් සහිත ශබ්ද යොදා වාක්‍යතුනක් තනනු.

2. ආධාරවිභක්තියෙහි චතුර්විධ භෙදයට උදාහරණ හතරක් දෙනු.

3. මෙහිපහත දක්වන කවෙහි ඇති ආධාරවිභක්ත්‍යන්ත පද වෙන්කොට පෙන්වනු.

“එබමුණු මන ක ලේ
කැඳවා ගොසින් එක ලේ
බරනැසට අස ලේ
විසී සරුවූ ගමක පිය ලේ”

——oo——

## 9. ආලපන විභක්තිය.

65. ආමන්ත්‍රණයෙන් යමෙකු තමහට අභිමුඛකරවීම ආලපන නම්.

ඒ කැඳවීමෙහි ව්‍යවහාරකරන වචනය ආලපන විභක්තිය ගනී.

මෙහි එකවචනයට අ, ආ, ඇ, ඒ, ඕ යන ප්‍රත්‍යයෝද බහුවචනයට ඉන්, ඉනි, එන්, එනි, නෙන් නෙනි, නි යන ප්‍රත්‍යයෝද යෙදෙත්.

උදාහරණ:—

| එකවචන. | බහුවචන. |
|---|---|
| අ– දරුව නුඹකලිදේ මොකද? | ඉන්, *“**සවන්න්** සැනමෙන් සදහමින්” |

---

*මේ ලකුණෙන් දක්වනශබ්දයෝ කථාව්‍යවහාරයෙහි නොපැනෙත්.

ආ-ළමයාමෙහෙවරෙන්. ඉනි, ගුරුවරයිනි සියබස් අත්නොහරිව්.

ඇ-පුතා තුඹගියේ කොහේද? එන්, *"සජ්ජනෙණ් මිගා පරලෙව්."

ඒ-අම්මේමටබඩගිනියි එනි, කොල්ලෙනි දඟ නොකරව්.

ඕ-කොරෝ තෝකෙසේ කඳු නැංගෙහිද? ඉතන්, *"සත්තෙන් දුලද නොබජව්"

තෙනි, වියත්තෙනි පැන විසඳව්.

නි, ගුරුනි යහසිරිත් නොහරිව්.

66. ආලපනවිභක්ත්‍යන්ත පදයටමුලින් එම්බා, බොල, කොල, හෙ යනාදිය යෙදෙන්බවද පැනේ.

උදා:- 1. එම්බා ළඳුරිය තිමවට අකිකරුවන්නෙහිද?

2. බොල මෙහෙකරුව තටකී වැඩකෙළෙහිද?

3 කොල දුදන මාවෙතින් පල.

4. හෙ සඳ කුමුදු පොබයව.

67. සංඥානාම විභක්ති නොගෙනම ආලපනයෙහි යෙදේ.

උදා:- 1. "මූසිල මෙපුර ත ට
නුවරෙක් නොවෙයි ඉඳින ට"

2. විලියම් මෙහෙවරෙන්.

——oo——

## 11 වෙනි අභ්‍යාස පාඨය.

මෙහිපහත දක්වන පදවල පැනෙන ආලපන විභක්ත්‍යන්තපද වෙන්කොට දක්වනු.

"කියග මගිය එනුකොයිස්ට දද සමනළ ගොසිනා"

"හේසඳකිමමුහුදු කිවසැඟවෙ නු වෙලන"

"සඳවනසිඳු කිය කුඹුයොන නමසකරා"

## 10. විභක්තීන් පිළිබඳ විශෙෂ කරුණු.

68. විභක්ති යනුද විභක්තිප්‍රත්‍යය යනුද එකාර්ථ හෙයින් කිසිශබ්දකෙනෙක් කුමනවිභක්ති භජනය කෙරෙත්දැයි දැනගැනීම විභක්ති ප්‍රත්‍යයන්ගෙන්ම කළයුතුයි. සමානප්‍රත්‍යයන් විභක්තිකීපයකම ඇති කල ඒවා කවරවිභක්තිකදැයි තෝරාගැනීම අර්ථානුසාරයෙන්ම කළයුතුවේ. නුමුත් කි සි වි ටෙ ක අර්ථයෙන් එකවිබතක් සෙවියයුතු පදයක් ප්‍රත්‍යයවශයෙන් අන්විබතක්ගනී. එබඳුතැන් මෙහිපහත විස්තර කරනුලැබෙත්.

### කර්ම විභක්තිය.

69. අවධිඅර්ථයෙහිද කර්මවිභක්තිය යෙදේ.

උදා:— මිනි මස වැලක්කෙමි.

මෙහි මිනිමසින් වැලක්කෙමි යන අවධිඅර්ථය ඇතිනමුත් මිනිමසකියා කර්මවිභක්ති ප්‍රත්‍යය ගත්හෙයින් ඒ අවධිඅර්ථයෙහි කර්මවිභක්තිය වේ.

70. ආධාරාර්ථයෙහිද කර්මවිභක්තිය යෙදේ.

උදා:— ගෙදර වසයි.

මෙහි ගෙදරෙහිවසයියන ආධාර අර්ථය ඇති නමුත් ගෙදරකියා කර්මවිභක්තිය ප්‍රත්‍යය ගත්හෙයින් ඒ ආධාරාර්ථයෙහි කර්මවිභක්ති වේ.

### 2. කරණවිභක්තිය.

71. කර්මාර්ථයෙහිද කරණවිභක්තිය යෙදේ.

උදා:— මලින් පුදමි.

මෙහි මල්කියා කර්මවිභක්ති නොගෙන මලින් කියා කරණවිබත් ගත්හෙයින් ඒ කර්මාර්ථයෙහි කරණ විභක්තිවේ.

72. **ආධාරාර්ථයෙහිද** කරණවිභක්තිය යෙදේ.

උදා:- **ගංඉවුරෙන්** ගියෙමි. **වේලාසනින්** දනගතිමි.

මෙහි ගංඉවුරේ වේලාසනැ කියා අදරවිබත් නොගෙන ගංඉවුරෙන් වේලාසනින් කියා කරණවිබත් ගත්හෙයින් ඒවා ආධාරාර්ථයෙහි කරණවිබත් වෙත්.

### 3 සම්ප්‍රදාන විභක්තිය.

73. කරණාර්ථයෙහිද සම්ප්‍රදාන විභක්තිය යෙදේ.

උදා:— **මස්සකට** සාල්නැළියක් ගතිමි.

මෙහි මස්සකින් කියා කරණවිභක්ති නොගෙන මස්සකටකියා සපදන්විබත් ගත්හෙයින් ඒ කරණාර්ථයෙහි සම්ප්‍රදානයි.

**ආධාරාර්ථයෙහිද** සම්ප්‍රදානවිභක්තිය යෙදේ.

උදා:— වැසි**කලට** ගංපිරෙත්.

මෙහි වැසිකල්හිකියා අදරවිබත් නොගෙන වැසිකලට කියා සපදන්විබත් ගත්හෙයින් ආධාරාර්ථයෙහි සම්ප්‍රදාන විභක්තිය වේ.

### 4. අවධි විභක්තිය.

75. **කරණාර්ථයෙහිද** අවධිවිභක්තිය යෙදේ.

උදා:— **කුසුමයන්ගෙන්** ගස ගැවසුණේයි.

මෙහි කුසුමයන්ගෙන් යනු කරණාර්ථවුවද අන්ගෙන් යන අවදිවිබත් ප්‍රත්‍යය ගත්හෙයින් ඒ කරණාර්ථයෙහි අවධි විභක්තිවේ.

ගෙන් යන්නෙන් යුතු ප්‍රත්‍යයක් කරණවිබත්වද ඇති බැව් පැනෙන නුමුත් සිදත්සඟරාවේ ඒ අවදිවිබත්කොටම සලකනලදී.

### ආධාර විභක්තිය.

76. ක්‍රියාවට සීමාවූ පදාර්ථය පදන්තර සංසර්ගයෙන් ආධාරවිභක්තිය ගනී.

උදා:— රජු නුවර සිට එයි.

මෙහි නුවර රජුගේගමන ක්‍රියාවට සීමාවුවද සිට යනපදය් අතරට ආ හෙයින් නුවර යනු ආධාර විභක්තියි.

77. කරණාර්ථයෙහිද ආධාරවිභක්තිය යෙදේ.

උදා:— රියෙහි ගමන්කරයි.

මෙහි රියෙන්කියා කරණවිබත් නොගෙන රියෙහි කියා අදරවිබත් ගත්හෙයින් මේ කරණාර්ථයෙහි ආධාරවිභක්තියි.

**6. එකමඅර්ථයෙහි විභක්තිදෙක යෙදෙන ස්ථාන.**

78. එකම අර්ථයෙහි කර්තෘ සහ සම්බන්ධවිභක්ති යෙදේ.

උදා:— තා සිටීම අපටයහපති. (තා කර්තෘ විභක්තියි.)

තාගේ සිටීම අපටයහපති. (තාගේ සම්බන්ධ විභක්තියි.)

එකමඅර්ථයෙහි අවධි සහ සම්ප්‍රදානවිභක්ති යෙදේ.

උදා:— චීන්නු ජපනුන්ගෙන් පැරදුනෝය.
(ජපනුන්ගෙන් අවධිවිභක්තියි.)
චීන්නු ජපනුන්ට පැරදුනෝය.
(ජපනුන්ට සම්ප්‍රදානයි.)

**7. ප්‍රත්‍යයයන් නොගත්තා විභක්ත්‍යර්ථ ශබ්ද.**

79. කාව්‍යභාෂායෙහි බොහෝවිට නාමශබ්ද ස්වකීයරූපය අත්නොහැර (වාක්‍යයන් නොගෙන) සියලුවිභක්ති භජනය කරති.

උදා:— නිල්මිණි රැස් පැති ර
තිල්වන සිතඹ පුරඹ ර
ගජමද ගෙන විසි ර
එපුර වහරෙව් දිසි හැඹව ර

මෙහි නිල්, වර්ණ, රස්, සිතඹ, පුරඹර, ගජ, මද, ඒපුර, වහර, හැමවර යන ශබ්ද ප්‍රකෘතියෙන් සිට නොයෙක් විභක්ති භජනාකාර තිබෙනබැව් පැනේ.

---

**12 වෙනි අභ්‍යාස පාඨය.**

මෙහිපහත දක්වන පාඨයන්හි ඇති නාමපදවල විභක්ති දක්වා ඒවා කවර අර්ථයන්හි යෙදී ඇත්දැයි පෙන්වනු.

(1) මත්බීම වැලැක්කෙමු. (2) නුවරවිසුයේයි. (3) වල්පාරෙන් පලයන්. (4) සිව්පසයෙන්පිදී. (5) රුපියලකට රෙද්දක් ගතිමි. (6) නියංකල ට වැව් සිඳේ. (7) මූවන්ගෙන් වනය ගහනවිය. (8) මහතෙම ගෙදරසිට ගියේය. (9) නැවෙහි ගියෙමි. (10) උදෙන් නැගිට්ටෙමි.

---

III **විශේෂණ විශෙෂ්‍ය** (වෙසෙසුන් වෙසෙස්)

80. යම්පදයක් වර්ණනාකරන පිණිස යොදන් නාවූ පද **විශේෂණ** නම්වෙත්.

ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා, සංඛ්‍යා යන ශබ්දයෝ විශෙෂණවශයෙන් යෙදෙත්.

උදාහරණ.—

ජාති විශෙෂණ-බමුණු ලියක්.
ද්‍රව්‍ය ,, -**දනවත්** වෙළෙන්දෙක්.
ගුණ ,, -**උස** ගහක්.
ක්‍රියා ,, -**නිදන** ළමයෙක්.
සංඥා ,, -**රන්මැණික්** නාතම් කෙල්ලක්.
සංඛ්‍යා ,, -**හතර** දෙනෙක්.

මෙහි "ලියක්" ආදිපද වර්ණනාකරනපිණිස බමුණු ආදිශබ්ද යොදාඇති බැවින් ඒවා විශෙෂණ වෙති.

81. වර්ණනාකරනු ලබන හෙවත් වෙසෙසනු ලබන පදය විශෙෂ්‍යයි.

බමුණුලියක් කීකල බමුණු යන්නෙන් ලිය කවර ජාතියකට අයත්දැයි වෙසසනු ලබනහෙයින් ලිය යනු විශෙෂ්‍යයි.

82. විශෙෂ්‍යය ප්‍රධාන පදයකියාද, විශෙෂණය අප්‍රධාන පදයකියාද කියත්.

83. විශෙෂණය තුල්‍යාධිකරණය, භින්නාධිකරණයයි දෙවැදෑරුම්.

(1) විශෙෂ්‍යපදයෙහි ඇති ලිඞ්ගවිභක්ති සහ වච නම ඒ හා බැඳෙන විශෙෂණ පදයත් භජනයකරන කල්හි ඒ විශෙෂණය තුල්‍යාධිකරණ නම්.

උදා:— නිල් තණ පියකරුයි; කුමරුවෝ දඩකෙළි ගියෝ වල්හි මංමුලාවූවෝයි.

මෙහි නිල් යන ගුණශබ්දය ප්‍රකෘතිරූපයෙන් සිටි යත් "තණ" යන පදයෙහි ලිඟුවිබත් ආදිය භජනය කරන හෙයින්ද, දඩකෙළිගියෝ යන්නෙහි ගියෝ යන අසමාප්ත ක්‍රියාව කුමරුවෝ යන පදයෙහි ලිඟුවිබත් ආදිය භජනයකරන හෙයින්ද නිල්, දඩකෙළිගියෝ යනු තණ සහ කුමරුවෝ යනු වෙසසන තුල්‍යාධිකරණ විශෙෂණයි.

තුල්‍යාධිකරණ යනු සම්වූ සම්බන්ධයයි. ඊට සමානාධිකරණයයිද කියනුලැබේ. සිදත්සඟරාවේ මීට නියම විශෙෂණ යයි නම්කර තිබේ.

(2) (අ) යම් විශෙෂණ පදයක් විශෙෂ්‍යපදයෙහි ඇති ලිඞ්ගවිභක්ති හා වචන භජනය නොකෙරේ නම් ඒ විශෙෂණය භින්නාධිකරණ නම්.

උදා:— රජ පිරිස බලවති.

මෙහි රජයන ශබ්දය පිරිස කුමක්දැයි වෙසසනුයේ නිල් තණ යන්නෙහි නිල්වූයේත් තණවූයේත් එක වස්තුවක් වන්නාක්මෙන් රජවූයේත් පිරිස වූයේත් එකම වස්තුවක් නොවී රජහුගේයයි භින්නාර්ථයක් ගෙනදෙන හෙයින් ඒ භින්නාධිකරණ විශේෂණයි. විශේෂ්‍යවූ පිරිස්ශබ්දය ප්‍රථමාවිභක්ත්‍යන්තවූවද විශේෂණයවූ රජ ශබ්දය සම්බන්ධවිභක්ති භජනය කෙරේ. විශේෂණය විශේෂ්‍යයෙන් වෙනස්වූ විභක්ති ආදිය භජනය කරනහෙයින් ඒ භින්නාධිකරණයි.

භින්නාධිකරණ යනු වෙන්වූ සම්බන්ධයයි. මීට අනියම් විශේෂණ යයි සිදත්සඟරාවේ නම්කරතිබේ.

(ආ) භින්නාධිකරණය **කරණ**විභක්ති භින්නාධිකරණය, **සම්ප්‍රදාන** විභක්ති භින්නාධිකරණය, **අවධි** විභක්ති භින්නාධිකරණය, **සම්බන්ධ**විභක්ති භින්නාධිකරණය, **ආධාර** විභක්ති භින්නාධිකරණයයි පස් වැදෑරුම් වේ.

උදාහරණ:—

(1) **කිරි**බත් හෙවත් කිරෙන් පිසූබත්
(2) **සිවුරු**පිළි ,, සිවුරුපිණිස ගන්නාපිළි
(3) **සොර**බිය ,, සොරුන්ගෙන්වන බිය.
(4) **එළු**මස් ,, එළුවාගේ මස්
(5) **පොල්**තෙල් ,, පොලෙහිතෙල්

මෙහි බත් කුමන බතක්දැයි වෙසසන කිරි යන්න කරණාර්ථයෙහි වේ.

පිළි කුමන පිළියක්දැයි ,, සිවුරු ,, සම්ප්‍රදානාර්ථයෙහි වේ.

බිය කුමන බියක්දැයි ,, සොර ,, අවධිඅර්ථයෙහි වේ.

මස් කුමන මසක්දැයි ,, එළු ,, සම්බන්ධඅර්ථයෙහි වේ.

තෙල් කුමන තෙලක්දැයි ,, පොල් ,, ආධාරාර්ථයෙහි වේ.

84. විශෙෂණපදය පූර්වකොටද විශෙෂ්‍යපදය පරකොටද යෙදීම සාමාන්‍ය විධියයි. නුමුත් කාව්‍ය භාෂාවෙහි ඒ කොහොමත් යෙදේ.

නියම විශෙෂණවශයෙන් යොදන අර්ථ ක්‍රියාශබ්ද බොහෝවිට විශෙෂ්‍යයට පරවම යෙදේ.

85. විශෙෂණවශයෙන් යෙදෙන කිසියම් ශබ්ද කෙනෙක් කිවිහුගේ කාමචාරයෙන් (කැමැත්තේ හැටියට) විශෙෂ්‍යකොටද යොදනු ලැබේ.

උදා:- (1) අරඑන්නී රත්මැණිකා නම් කළුගැහැනිය.
(2) අරඑන කළුගැහැනී රත්මැණිකා නම්.

මෙහි පළමුවෙනි වාක්‍යයෙහි රත්මැණිකා යන්න විශෙෂණවශයෙන්ද එමඅර්ථයෙහිම යෙදුණු දෙවෙනි වාක්‍යයෙහි රත්මැණිකා යන්න විශෙෂ්‍යවශයෙන්ද යොදාතිබේ.

මහලුබමුණා යනු බමුණුමහල්ලා ආදිවශයෙන් යෙදීම කිවිකමසරින් වේ.

86. කාව්‍යාදි අර්ථදීමේදි විශෙෂණය පෙන්වීමට "වූ" යන ධාතුව යොදනු ලැබේ.

උදා:— "මිණි බිම දිසි දිමු ත්
පහගලෙල දෙන දද යු ත්
වැද සිදු සපුත් ග ත්
ගුරුළු දහසෙව් දන නුවන් ග ත්"

මෙහි දිසි, දිමුත්, ලෙලදෙන, දදයුත්, ගත්, යන විශෙෂණශබ්ද දිසිවූ, දිමුත්වූ, ලෙලදෙන්නාවූ, දදයුත්වූ, ගත්තාවූ යන ක්‍රමයට ව්‍යාඛ්‍යාන කළ කල විශෙෂණපදය පැහැදිලිව පෙනේ.

### 18 වෙනි අභ්‍යාස පාඨය.

1. ජාති, ගුණ සහ ක්‍රියාශබ්ද විශෙෂණකොටද, ද්‍රව්‍ය, සංඥ සහ සංඛ්‍යාශබ්ද විශෙෂ්‍යකොටද යොද වාක්‍යභයක් තනනු.

2. ද්‍රව්‍ය, සංඥ සහ සංඛ්‍යාශබ්ද විශෙෂණ කොටද, ජාති, ගුණ සහ ක්‍රියාශබ්ද විශෙෂ්‍ය කොටද යොද වාක්‍යභයක් සාදනු.

3. මෙහිපහත දක්වන පාඨවල සමානාධිකරණ විශෙෂණපද හා භින්නාධිකරණ විශෙෂණපද වෙන් කොට පෙන්වනු.

(1) මිණිතොරණ (2) දෙමළගී (3) මහවැලිගම (4) තුගුසල්පිල් (5) දුලමිණිගන (6) සිරිලක (7) යනෙතලිය (8) බමුණුගෑනී (9) "පිරිසර සවිය රස" (10) "රත්සලබ සලසලා"

---

## IV. උක්තානුක්ත.

87. උක්තයනු කියනුලැබීමයි. අනුක්තයනු කියනු නොලැබීමයි.

කර්මාර්ථයාගේ විභක්තිය කර්මවිබත්තය. කර්තෘාර්ථයාගේ විභක්තිය කතුවිබත්තය. නුමුත් කර්මාර්ථයා නිෂ්ඨාක්‍රියාවකින් උක්තවන හෙවත් කියනු ලබන කල්හි කර්මවිබත හැර ප්‍රථමාවිභක්තිය භජනය කෙරේ. ඊට උක්තකර්මයයි කියති.

කර්මාර්ථයා නිෂ්ඨාක්‍රියාවකින් උක්තනොවන කල්හි ඒ ස්වකීය විභක්තිය භජනය කෙරේ. ඊට අනුක්ත කර්තෘයයි කියති.

එසේම කර්තෘාර්ථයා නිෂ්ඨාක්‍රියාවකින් උක්තවන හෙවත් කියනුලබන කල්හි කතුවිබත හැර ප්‍රථමා විභක්තිය භජනය කෙරේ. ඊට උක්තකර්තෘයයි කියති.

කර්තෘඛ්‍යා නිෂ්ඨාක්‍රියාවකින් උක්ත නොවන කල්හි ඒ ස්වකීය විභක්තිය භජනයකෙරේ. ඊට අනුක්ත කර්තෘයයි කියති.

නිෂ්ඨාක්‍රියාව යනු වාක්‍යයක අවසාන ක්‍රියාවයි. ත්‍රෛකාලික ක්‍රියාද, විධික්‍රියාද, ප්‍රයෝජ්‍යක්‍රියාද, ආශිර්වාද ක්‍රියාද අවසානක්‍රියාමෙන් යෙදෙත්.

88. කර්මකාරකක්‍රියාවක් හා බැඳෙන්නේ හෙවත් එයින් උක්තවන්නේ කර්මාඛ්‍යාතය.

උදා:— රන්කරුවාවිසින් මුදුව සෑදිණි (හෝ සාදන ලදී.

මෙහි සෑදිණි හෝ සාදනලදි යන කර්මකාරක නිෂ්ඨාක්‍රියාවෙන් උක්තවූයේ මුදුවයන කර්මයයි. එබැවින් ඒ උක්ත කර්මයයි. ප්‍රථමාවිභක්තිය භජනය කෙරේ. මෙහි රන්කරුවායන කර්තෘ අනුක්තව සියවිබතම ගෙන තිබේ.

89. කර්තෘකාරකක්‍රියාවක් හා බැඳෙන්නේ හෙවත් එයින් උක්තවන්නේ කර්තෘඛ්‍යාතය.

උදා:— රන්කරුවා මුදුව සෑදීය.

මෙහි සෑදීය යන කර්තෘකාරක නිෂ්ඨාක්‍රියාවෙන් උක්තවූයේ රන්කරුවායන කර්තෘයි. එබැවින් ඒ උක්ත කර්තෘයි. ප්‍රථමාවිභක්ති භජනයකෙරේ. මෙහි මුදුව යන කර්මය අනුක්තව සියවිබතම ගෙනතිබේ.

කර්මය උක්තවූකල කර්තෘ අනුක්තවේ. කර්තෘ උක්තවූකල කර්මය අනුක්තවේ. ඒ යටදැක්වූ නිදසුන් දෙකෙන් සුප්‍රකාශයි.

90. කර්මකාරක විධික්‍රියාදියෙන් කර්මය උක්තවනපරිදි මෙහිපහත දක්වන නිදර්ශනවලින් පෙනේ.

(1) මුදුව සාදනුලබව. (විධික්‍රියා)

(2) මුදුව සාදවනු ලැබී. (ප්‍රයොජ්‍යක්‍රියා)
(3) මුදුව සාදනු ලැබේවා. (ආශිර්‍වාදක්‍රියා)

91. කර්‍තෘකාරක විධික්‍රියාදියෙන් කර්‍තෘ උක්ත වනපරිදි මෙහිපහත දක්වන නිදර්‍ශනවලින් පෙනේ.

(1) තෝ මුදුව සාදව. (විධික්‍රියා)
(2) රන්කරුවා මුදුව සැදවී (ප්‍රයොජ්‍යක්‍රියා)
(3) රන්කරුවා මුදුව සදුවා (ආශිර්‍වාදක්‍රියාව)

92. අර්‍ථක්‍රියාවෙන්ද කර්‍ම කර්‍තෘ උක්තකරනු ලැබෙත්.

උදා:— (1) රන්කරුවාවිසින් මුදුව සාදනලද්දී. (කර්‍මකාරක)
(2) රන්කරුවා මුදුව සැදූ. (කර්‍තෘ කාරක)

අර්‍ථක්‍රියාශබ්දයෝ එයින් උක්තවන පදයන්ගේ ලිඟු, විබත්, වචන භජනය කෙරෙත්. මෙහි මුදුව සත්‍රී ලිඞග, ප්‍රථමාවිභක්ති එකවචන වේ. සාදනලද්දී යනුද එසේමැයි. රන්කරුවා පුරුෂලිඞග, ප්‍රථමාවිභක්ති එකවචනයි. සැදූයනුද එසේමැයි.

93. අන්‍යාර්‍ථ සමාසයක් හෝ යම්කිසි ප්‍රත්‍යයක් හෝ යම් යම් විභක්තිකාරක අර්‍ථයක කරනුලැබේ නම් එයින් සිද්ධවූ ඒ සමාස, ප්‍රත්‍යාර්‍ථශබ්දයන් විසින් ඒ ඒ විභක්ති අර්‍ථයෝ උක්තනම් කරනුලැබෙත්. ඒ මෙසේයි.

1. උක්ත කර්‍මාර්‍ථ ශබ්ද.

සමාස— **එරුණුහස්**- හංසයා එරුණේ යමක්ටද ඒ කර්‍මවාචිසථානතෙම එරුණු හස්නම්. තඩාගයයි. මෙහි සමාසයෙන් උක්තවූ කර්‍මාර්‍ථවූ එරුණුහස් ශබ්දය කර්‍මවිබත් හැර පෙරවිබත් භජනය කරයි.

තද්ධිත— **නැව්**- කර්ම්මාර්ථ නැව්ශබ්දයා කෙරෙන් පදවන්නා යන අර්ථඇති ඉ ප්‍රත්‍යය වැටී මෙන් නාවිකයා සිද්ධව ප්‍රත්‍යයෙන් උක්තවූ හෙයින් ඒ පෙරවිබත් බෙජේ.

කෘදන්ත—**පැන්**- පා ධාතුහු කෙරෙන් පියයුතුදේ යන කර්ම්මාර්ථයෙහි ඇන් ප්‍රත්‍යයවැටී පැන්කියා සිද්ධව ප්‍රත්‍යයෙන් උක්තවූ හෙයින් ඒද පෙරවිබත් බෙජේ.

මෙහි එරුණුහස්, නැව්, පැන්යන ශබ්ද සමාස හා ප්‍රත්‍යයන්ගෙන් උක්තවූහෙයින් ඒ එක එක නාම මාත්‍රය ප්‍රථමාවිභක්තිය ගන්නා නමුදු යලිත් ඒවා වාක්‍යයක යෙදෙන හැටියට නානා විභක්ති ප්‍රත්‍යවත්ව ඒ ඒ විභක්ති භජනය කෙරෙති.

අවශෙෂවිභක්ති සම්බන්ධව මතුදක්වන උදාහරණද මේ නයින්ම අවබොධ කටයුතුයි.

**2. උක්ත කර්‍තෘඅර්ථ ශබ්ද.**

සමාස— **දැමිඳුරු**- ඉඳුරෝ දමනය කරනලද්දේ යමෙකු විසින්ද ඒතෙම දැමිඳුරු. මුනියි.

කෘදන්ත— **වැදි**- විදීම් කරන්නෝයමකු විසින්ද ඒතෙමේ වැදියි.

**3 උක්ත කරණාර්ථ ශබ්ද.**

සමාස— **සුන්තුරු**- යමක් කරණකොට තුරුසුන් වේද ඒ සුන්තුරුයි. පොරවයි.

තද්ධිත— **රන්මුවා**- රනින් කරනලද්දේ යමක්ද ඒ රන්මුවායි. රන්මය යනුයි.

කෘදන්ත— **වසන්**-යමකින් වසනුලැබේද ඒ වසන්නුයි. වස්ත්‍රයි.

**4 උක්ත සම්ප්‍රදානාර්ථ ශබ්ද.**

සමාස— **දුන්වන්**-දෙනලද වස්ත්‍ර යමක් හටද එතෙම දුන්වන්නම්. බමුණුයි.

තද්ධිත— පදී- පදයන්ට හිතවූයේ පදීනම්. ගාථා ශ්ලෝකාදිය.

කෘදන්ත— දනි- ඕහට දෙනුලැබේනුයි ද නි යි. බමුණුයි.

**5. උක්ත අවධි අත්‍ථි ශබ්ද.**

සමාස— **ගුළුගොනගුල්**—වඳුරු වැටුණේ යමකින්ද එතැන ගුළුගොනගුල් නම්. රුකයි.

තද්ධිත— **ගාල්ලා**—ගාල්ලෙන්පැමිණියේ යමෙක්ද ඒතෙමේ ගාල්ලායි. ගාලුපුර මිනිසෙකි.

කෘදන්ත— **බෙමි**—යමකුකෙරෙන් බියපැමිණේද ඒ තෙමේ බෙමිනුයි. රකුසුයි.

**6. උක්ත සම්බන්ධාත්‍ථි ශබ්ද.**

සමාස— **සඳවත**—සඳවන් වත් ඇත්තී සඳවතනම්. සත්‍රියි.

තද්ධිත— **මන්වා**—මනුහුපීත් මන්වායි. නරයි.

**7. උක්ත ආධාරාත්‍ථි ශබ්ද.**

සමාස— **මත්තේ ගජ**- අනෙක මත්තගසතීන් ඇති යේ මත්තේගජයි- අරණ්‍යයයි.

තද්ධිත— **ගැමි**-ගමෙහිවූයේ ගැමියි- ගම්වැසියායි.

කෘදන්ත— **හිමි**-එහිවෙත්නුයි හිමි- භූමියයි

**සැලකියයුතුයි**. (1) කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර යන විභක්ත්‍යන්තයෝ නිත්‍යා ක්‍රියාවකින් හෝ අත්‍ථික්‍රියාවකින් උක්තනොවෙත්.

(2) ප්‍රථමාවිභක්ත්‍ය හජ නයකරන පදයක් හා සම්බන්ධ කිරීමට ක්‍රියාවක් නැතිකල "වූ" ධාතු වෙන් ක්‍රියාවක් සිද්ධකටයුතුයි.

උදා:— එරුණුහස් = එරුණුහස් වේ.

——oo——

### 14 වෙනි අභ්‍යාස පාඨය.

(1) නිෂ්ඵාක්‍රියාවකින් කර්තෘ උක්තවන හැටි උදාහරණ හතරකින් පෙන්වනු.

(2) අභිඛ්‍රියාවකින් කර්ම, කර්තෘ උක්තවන අන්දමට වාක්‍යහතරක් තනනු.

(3) පෙවුණි, විසයි, ගියෝ, කියනලදී, කැවුණි, එයි, දුවන්නෝ, සිටින්නී යන ක්‍රියාපදයන් හා සුදුසු විභක්ත්‍යන්ත නාමපදයොද වාක්‍යඅටක් තනනු.

---

## V. කාරක. (කරු)

94. ක්‍රියා නිෂ්පත්තියට හේතුවන්නේ **කාරක** නම්.

කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදන, අවධි, ආධාරයන සය ක්‍රියා අර්ථයාගේ ඉපදීමට හෙතුවනහෙයින් ඊට ක්‍රියාව කෙරෙයියන අර්ථයෙන් කාරකයයි නම් කරනලදී.

බත කීකල පිසුවේ කෑවේ ආදි ක්‍රියාද, මිනිසා, කීකල ආවේ ගියේ ආදි ක්‍රියාද, පිහියෙන් කීකල කැපී කෙටී ආදි ක්‍රියාද, යදියාට කීකල දුනිම් ආදි ක්‍රියාද, ගසෙන් කීකල වැටුණේය ආදි ක්‍රියාද, ඇඳේ කීකල නිදයි ආදි ක්‍රියාද පහළවෙත්.

නුමුත් සම්බන්ධ හා ආලපන දෙ දෙනාගෙන් එබන්දක් සිදුනොවේ. එබැවින් ඊට අකාරක විභක්ති යයි කියනු ලැබේ.

ගොනාගේ කීකල අහක් හමක් ආදි වෙනින් නාමයක්මමුත් ක්‍රියාවක් නූපදී. මිතුරු කීකල තුඹ, තෝ ආදි සර්වනාමයක්මමූත් ක්‍රියාවක් හටනොගනී.

කර්ම, කර්තෘ දෙදෙන උක්තවීමෙන් ප්‍රථමා විභක්තිය යෙදෙන හෙයින් ඒද කාරක ගණයට ඇතුලත් නොවේ.

95. පුරුෂත්‍රයට හා සාධනත්‍රයටද කාරකයන් නාමය කිසිවිටෙක ව්‍යවහාරවේ. ඒ අන්‍යකාරක, තශබ්ද කාරක, මශබ්ද කාරක, කර්තෘකාරක, කර්මකාරක, භාවකාරක යනුයි. ඒ අන්‍යාකාර විධානයකි. මීට ඇතුලත් නොවේ.

96. ක්‍රියාපදයක් හා සමග යථෝක්ත කාරක විභක්තීන්යෙදීම **ක්‍රියාකාරක පද සම්බන්ධය** නම්. මේ සම්බන්ධයෙන් පිටවූ කැමති අර්ථයන් ප්‍රකාශකළ හැකි වාක්‍යයෙක් නොමැතියි.

උදා:— පඬුවෝ මසුරුමලින් තොරව දුහුනන් කෙරෙහි කුලුණෙන් පරවැඩපිණිස පොත් පත් කළෝ.

මෙහි **පඬුවෝ** යනු කර්තෘකාරකයි. **මසුරුමලින්** යනු අවධිකාරකයි. **දුහුනන්කෙරෙහි** යනු ආධාර කාරකයි. **කුළුණෙන්** යනු කරණකාරකයි. **පරවැඩපිණිස** යනු සම්ප්‍රදාන කාරකයි. **පොත්පත්** යනු කර්ම කාරකයි.

97. වාක්‍යයක අවසාන ක්‍රියාවට ආවශ්‍යක වන්නේ කර්තෘ හෝ කර්මයබැවින් ක්‍රියාකාරක පද සම්බන්ධය දක්වීමේදි කර්තෘ කර්ම ක්‍රියා යන තුන පමණක් ගෙනපෑම බෙහෙවින් ව්‍යවහාරයට පැමිණතිබේ

යටදැක්වූ උදාහරණයෙහි "පඬුවෝ පොත්පත් කළෝ" යන්න ක්‍රියා කාරකපද සම්බන්ධයකොට සලකති.

98. ඇතැම්කාරක · පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා සමග සම්බන්ධවන නුමුත් නිෂ්ඨාක්‍රියාවක් නැතිව නියම ක්‍රියාකාරක සම්බන්ධයක් සම්පාදනය නොවේ.

"අතින් ගෙන" කියල අතින්යන කරණකාරකය ගෙනයන පූර්වක්‍රියාව හා සම්බන්ධවන නුමුත් එහි අර්ථ ප්‍රකාශකරන වාක්‍යයෙක් නොපැනේ. නුමුත් "අතින්ගතිමියි" කියල නිෂ්ඨාක්‍රියාවක් ඇතිවූ හෙයින් නියම වාක්‍යයක් සිද්ධවිය.

පාරේ යමින්, ගහෙන් වැටුණොත් ආදියද මේ නයින් සැලකියයුතු.

99. වාක්‍යයක කාරක සයම යෙදියයුතුයයි කල්පනා නොකොට යුතුයි. කිසිවිටෙක තනිකාරකයක්ද, ඇතම්විට දෙකක් හෝ කීපයක්ද යෙදෙත්. ඒ යථාලාභ වශයෙන් වේ.

උදාහරණ:—

(1) ළමයා අඬයි (කර්තෘකාරකය පමණකි)

(2) ළමයා කිරිබොයි (කර්තෘ කර්මකාරක දෙක පමණකි)

(3) ළමයා සතුටින් කිරිබොයි (කර්තෘ, කරණ, කර්ම කාරක තුන පමණකි)

100. වාක්‍යයක් ඇතිවීමට කර්තෘකාරකය ආවශ්‍යකමැයි. ඒ නොයෙදූතැන අධ්‍යාහාරයෙන් ගැනේ.

"යන්නෙමි" යනු අසම්වත් වාක්‍යයෙකි. එහි කර්තෘවන එකවචනාන්ත උත්තමපුරුෂයා අධ්‍යාහාරයෙන් ගැනේ.

———oo———

### 15 වෙනි අභ්‍යාස පාඨය.

(1) කාරක තුනකින්යුත් වාක්‍ය හතක් තනනු.

(2) කාරක හතරකින්යුත් වාක්‍යපහක් තනනු.

(3) කාරක පහකින්යුත් වාක්‍ය තුනක් තනනු.

(4) කාරක සයින්මයුත් වාක්‍ය දෙකක් තනනු.

(5) කර්තෘඅධ්‍යාහාරවන වාක්‍යයක්ද, කර්මය අධ්‍යාහාරවන වාක්‍යයක්ද තනිකාරකයකින් යුත් වාක්‍යදෙකක්ද සම්පාදනය කරනු.

## ශුද්ධපත්‍රය.

| පිට. | පෙළ. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 12 | 3 | "අ" | "ආ" |
| 27 | 11 | "ගෙන්" යන්නකින් යුත් කරණවිභක්ති ප්‍රත්‍යයෝද | කරණවිභක්ති ප්‍රත්‍යයෝද "ගෙන්" යන්නකින් යුත් |
| 31 | 2 | ආ ප්‍රත්‍යයවත් | අ ප්‍රත්‍යයවත් |
| 33 | 6 | වල යන ප්‍රත්‍යයෝද | වල, වලැ යන ප්‍රත්‍යයෝද |
| 37 | 19, 20 | කුසුමයන්ගෙන් | කුසුමන්ගෙන් |
| 38 | 24 | වාක්‍යයන් | ප්‍රත්‍යයන් |
| 43 | 25 | කර්තෘයයි | කර්මයයි |
| 48 | 6 | විසයි | වසයි |
| 48 | 25 | මිතුරැ | මිතුරු |
| 49 | 10 | තොරුව | තොරවැ |
| 50 | 5 | යතාලාභ | යථාලාභ |



